www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| දේශපාලන විද්‍යාව I<br>அரசியல் விஞ்ஞானம் I<br>Political Science I | 23 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

විභාග අංකය: ......................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
※ **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
※ එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 – 3 | |
| 2 | 4 – 11 | |
| 3 | 12 – 19 | |
| 4 | 20 – 25 | |
| 5 | 26 – 30 | |
| 6 | 31 – 36 | |
| 7 | 37 – 43 | |
| 8 | 44 – 50 | |
| **එකතුව** | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

● අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය
(1) රාජ්‍ය පරිපාලන කටයුතුවලට සීමා වන්නකි.
(2) සැමවිට ම සමාජ සුභසාධනය පිළිබඳව සැලකිලිමත් වෙයි.
(3) මැතිවරණ ක්‍රියාදාමයට සීමා වේ.
(4) පුරවැසියන් අතර පවතින සමාජ භාවිතයකි.
(5) සමාජයේ සදාචාරාත්මක ඇගයුම් අධ්‍යයනය කිරීමකි. (......)

**2.** දේශපාලන විද්‍යාව
(1) දේශපාලන බලය ලබාගැනීම අරමුණු කර ගනියි.
(2) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට සීමා වේ.
(3) සමාජීය විද්‍යා ක්ෂේත්‍රයෙහි ශාඛාවකි.
(4) පක්ෂ දේශපාලනය අධෛර්ය කරයි.
(5) ව්‍යවහාර ඥානය මත පදනම් වේ. (......)

**3.** ව්‍යවස්ථානුකූලවාදය
(1) සංවරණ සහ තුලන මූලධර්මය යටපත් කරයි.
(2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායට එරෙහිව යයි.
(3) දූෂණ සහ බලය අපහරණය කිරීම ප්‍රවර්ධනය කරයි.
(4) විධායකය සහ ව්‍යවස්ථාදායකය තුළ රාජ්‍ය බලය ඒකරාශී වීමට හැකියාව ලබා දෙයි.
(5) පුරවැසියන්ගේ මූලික අයිතීන් සහ නිදහස සුරක්ෂිත කරයි. (......)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**4.** සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
(1) සම්භවය ලැබුවේ 17වන සියවසේ දී ය.
(2) ලිබරල්වාදය සමඟ සමීපව සම්බන්ධ වී තිබිණි.
(3) බ්‍රිතාන්‍ය කොන්සර්වටිව් පක්ෂයේ දේශපාලන මතවාදය විය.
(4) ධනවාදය සහ සමාජවාදය යන දෙකෙහිම ලක්ෂණවල සංයෝගයකි.
(5) ආර්ථික අසමානතා අහෝසි කිරීමට ධනවාදයට පවතින හැකියාව විශ්වාස කළේ ය. (......)

**5.** නීතියේ ආධිපත්‍යය
(1) ආණ්ඩුවේ නිලධරතන්ත්‍රයේ ආධිපත්‍ය බලය සාධාරණය කරයි.
(2) ජාතික හදිසි අවස්ථාවල දී අත්තනෝමතිකව ක්‍රියා කිරීමේ හැකියාව ආණ්ඩුවට ලබාදෙයි.
(3) ආණ්ඩුවේ තීරණ සැමවිට ම බහුතරයේ කැමැත්ත පිළිබිඹු කළ යුතු බව අවධාරණය කරයි.
(4) දේශපාලන බලය වගවීමෙන් තොරව භාවිත කිරීම වැළැක්වීම අරමුණු කරයි.
(5) සමාජවාදයේ නෛතික සංකල්පයකි. (......)

**6.** රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරයට ඇතුළත් වන්නේ,
(1) දේශපාලන බලය ලබා ගැනීම සඳහා පමණක් මහජන ගැටලු ප්‍රයෝජනයට ගැනීමයි.
(2) රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵල පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් ලබා දීමයි.
(3) ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ ජනතා සහභාගිත්වය සීමා කිරීමයි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය මගින් පෞද්ගලික අභිලාෂ ප්‍රවර්ධනය කිරීමයි.
(5) පක්ෂ නායකත්වය ප්‍රතිපත්ති විවාදවලට සම්බන්ධ වීම අධෛර්ය කිරීමයි. (......)

**7.** ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවණතාවලට ඇතුළත් වන්නේ,
(1) සාම්ප්‍රදායික පක්ෂ මතවාද අඛණ්ඩව පවත්වාගෙන යාමයි.
(2) ජනවාර්ගික-ආගමික පක්ෂ අතුරුදහන් වීමයි.
(3) සාම්ප්‍රදායික වාමාංශික පක්ෂවල ජනප්‍රියත්වය වර්ධනය වීමයි.
(4) සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂ දෙක පිරිහීමට පත්වීමයි.
(5) පක්ෂ අභ්‍යන්තර ගැටුම් අඩු වීමයි. (......)

**8.** ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) නියෝජනය ලබා ගැනීමට කුඩා පක්ෂවලට වැඩි අවකාශ ලැබීමයි.
(2) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අඩු වීමයි.
(3) ජාතික ලැයිස්තුව හඳුන්වා දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමයි.
(4) මැතිවරණ ප්‍රචාරණය සඳහා යොදවන වියදම් අඩු වීමයි.
(5) ජනවාර්ගික අනන්‍යතාව සහිත දේශපාලන පක්ෂ බිහිවීම වැළැක්වීමයි. (......)

**9.** ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) මගින්
(1) රාජ්‍ය සේවය දේශපාලන විධායකයේ පාලනයෙන් නිදහස් කෙරිණ.
(2) රාජ්‍ය සේවකයන් පත්කිරීමේ හා මාරුකිරීමේ බලය කැබිනට් අමාත්‍යවරුන්ට පැවරිණි.
(3) රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය අහෝසි කරන ලදී.
(4) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිපාදන හඳුන්වා දෙන ලදී.
(5) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ක්‍රියාවලිය නිර්දේශපාලනීය කෙරිණි. (......)

**10.** ජාතික අභිලාෂ සාධනය කරගැනීමට ජාත්‍යන්තර දේශපාලනය තුළ ඇති මාධ්‍යයක් වන්නේ,
(1) රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ය.
(2) දේශපාලන පක්ෂ ය.
(3) බහුජාතික සමාගම් ය.
(4) ප්‍රභූ කණ්ඩායම් ය.
(5) සමාජ ව්‍යාපාර ය. (......)

**11.** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය
(1) දකුණු ආසියානු කලාපයේ රාජ්‍යවල වැදගත්කම නොසලකා හැරියේ ය.
(2) සමාජවාදී මතවාදය මගින් මෙහෙයවනු ලැබිණ.
(3) හැඩගැසුණේ බලයට පත් පාලන තන්ත්‍රවල මතවාද සහ අභිලාෂවලිනි.
(4) ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීමේ වාසිය සැමවිට ම නොසලකා හැර ඇත.
(5) එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මගින් නිශ්චය කරනු ලැබ ඇත. (......)

[තුන්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**12.** දේශපාලන විද්‍යාවේ චර්යාවාදී ප්‍රවේශය
(1) සම්භාව්‍ය ග්‍රීක යුගය දක්වා දිවෙන ඉතිහාසයකට හිමිකම් කියයි.
(2) ආනුභවික පර්යේෂණ සමග සම්බන්ධ විය.
(3) දේශපාලන ආයතනවල ඉතිහාසය අවධාරණය කරයි.
(4) ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයින්ගේ සහාය ලබා ගැනීමට අසමත් විය.
(5) පුද්ගල දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම නොසලකා හරියි. (......)

**13.** ආණ්ඩුව
(1) රාජ්‍යයට වඩා දිගුකාලීන පැවැත්මක් සහිත ය.
(2) සමාජයේ දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි.
(3) රාජ්‍යයේ මූලික ආයතනික නියෝජිතයා ය.
(4) ජාතියේ බාහිර ස්වාධිපත්‍යට හිමිකම් කියයි.
(5) රාජ්‍යය යන සංකල්පයට සමාන අර්ථයක් දෙයි. (......)

**14.** ඉන්දියානු නිරාගමිකවාදයෙන් අදහස් කරනුයේ,
(1) සෑම ආගමක් ම රාජ්‍ය ආගම් ලෙස සැලකීමයි.
(2) රාජ්‍යය සියලු ආගම්වලට අපක්ෂපාතව සැලකීමයි.
(3) සියලු පුරවැසියන්ගේ ජනවාර්ගික අනන්‍යතාවලට ගරු කිරීමයි.
(4) සුළුතර ආගම්වලට විශේෂ සැලකිලි දැක්වීමයි.
(5) ආගමික ඉගැන්වීම් සම්බන්ධ මතභේද විසඳීමට ආණ්ඩුව මැදිහත් වීමයි. (......)

**15.** ලිබරල්වාදය
(1) රාජ්‍යය පවතින්නේ පන්ති සහිත සමාජ තුළ බවට තර්ක කරයි.
(2) පුරවැසියන්ගේ පුද්ගලික නිදහස සුරක්ෂිත කිරීම අරමුණ කරගනියි.
(3) වෙළෙඳ කටයුතු තුළ රාජ්‍යයේ මැදිහත්වීම ප්‍රවර්ධනය කරයි.
(4) මාක්ස්වාදීන්ගේ සහයෝගය ලැබූ දේශපාලන මතවාදයකි.
(5) සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය අධෛර්යයට පත් කරයි. (......)

**16.** ස්විස්ටර්ලන්තය
(1) සතු ආණ්ඩුක්‍රමය, අර්ධ සන්ධීය යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශිත ය.
(2) දියුණු සන්ධීය ක්‍රමයක් පවතින සාපේක්ෂ වශයෙන් විශාල රටකි.
(3) හවුල් පාලනයට (shared-rule) සහ ස්වයං පාලනයට (self -rule) ඉඩ සපයන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්මයක් සහිත රටකි.
(4) කැන්ටන් ඒකකවලට ස්වයං පාලන බලතල ලබා නොදෙයි.
(5) සතුව තිබෙන්නේ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි. (......)

**17.** ඇමෙරිකානු එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) බලතල වෙන්කිරීමට ඉඩ සලසන්නේ නැත.
(2) සමූහාණ්ඩුවාදය ප්‍රතික්ෂේප කොට ඇත.
(3) පෙර පැවති ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසිකොට පිහිටුවනු ලැබ ඇත.
(4) විදේශ රාජ්‍ය සමඟ ගිවිසුම්වලට එළැඹීමට ප්‍රාන්තවලට බලය ලබා දී ඇත.
(5) මධ්‍යම ආණ්ඩුවෙහි බලතල පමණක් දක්වා සිටියි. (......)

**18.** ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදාළ මූලධර්මය වන්නේ,
(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන්ව මැතිවරණ පැවැත්වීමයි.
(2) විධායකය එහි පැවැත්ම සඳහා ව්‍යවස්ථාදායකය මත පදනම් වීමයි.
(3) ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා නොවීමයි.
(4) විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ නිල කාලය එකවර අවසන් වීමයි.
(5) ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සාපේක්ෂ වශයෙන් පහසු ක්‍රියාදාමයක් වීමයි. (......)

**19.** වෙස්ට්මින්ස්ටර් මාදිලියේ ආණ්ඩුක්‍රමය
(1) ප්‍රංශ ආණ්ඩුක්‍රමයට සමාන වේ.
(2) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ ප්‍රතිපාදන සහිත වේ.
(3) පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය උත්තරීතර කොට සලකයි.
(4) නීති අධිකරණ විමර්ශනයට ලක් කිරීමට ඉඩ සලසයි.
(5) කැබිනට් අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීමට අවකාශ ලබා නොදෙයි. (......)

[හතරවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**20.** ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
(2) ආණ්ඩුකාරවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා බවට පත් කළේ ය.
(3) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක් සඳහා පදනම දැමී ය.
(4) වාර්ගික නියෝජනය ප්‍රවර්ධනය කළේ ය.
(5) ස්ත්‍රීන්ට ඡන්ද අයිතිය ලබාදීම ප්‍රතික්ෂේප කළේ ය. (......)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** සෝල්බරි ව්‍යවස්ථාවේ වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ වූයේ,
A - අග්‍රාණ්ඩුකාරවරයා නාමමාත්‍ර විධායකය වීම ය.
B - දේශපාලන විධායකය පාර්ලිමේන්තුව මගින් තෝරා පත්කර ගැනීම ය.
C - ව්‍යවස්ථාදායකය ද්වි-මාණ්ඩලික වීම ය.
D - අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම ය.
E - අග්‍රාණ්ඩුකාරවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**22.** ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
A - සිවිල් සහ දේශපාලන අයිතීන් සහතික කරයි.
B - මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ඕනෑම අධිකරණයකට පෙත්සම් ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට අවස්ථාව සලසයි.
C - මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දෙයි.
D - සාමූහික සහ සමාජ අයිතීන් ඇතුළත් නොවීම නිසා විවේචනයට ලක් වේ.
E - හදිසි අවස්ථාවක් පැනවූ විට මූලික අයිතිවාසිකම් මත සීමා ඇති කරයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**23.** සාමය ගොඩනැගීම
A - බිම් මට්ටමේ සාම ප්‍රයත්න පමණක් ප්‍රවර්ධනය කරයි.
B - එක් එක් රටවල සුවිශේෂ තත්ත්වයන්ට අනුව සකස් වේ.
C - දිග්ගැස්සුණු ගැටුම් සිදුවන සමාජයන්හි චිරසර සාමය අවධාරණය කරයි.
D - පුරවැසියන් සහ සිවිල් සමාජ ව්‍යාපාරවල සහභාගිත්වය අවධාරණය කරයි.
E - සාධනීය හා නිෂේධනීය සාමය (positive and negative peace) යන දෙඅංශයෙන් ම සමන්විත වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**24.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) යටතේ පැවැති ව්‍යවස්ථාදායකය
A - අධිකරණ අධීක්ෂණයට යටත් නොවී ය.
B - රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය ලෙස සැලකිණි.
C - බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආකෘතියෙන් වෙනස් විය.
D - ද්වි මාණ්ඩලික විය.
E - නිල වශයෙන් හඳුන්වන ලද්දේ ජාතික රාජ්‍ය සභාව ලෙස ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

**25.** ඇමෙරිකානු සන්ධීය ආණ්ඩු ක්‍රමය
A - ප්‍රාන්ත රාජ්‍යවල ස්වායත්තතාව යන අදහස මත පදනම් ව ගොඩනැගිණි.
B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා ප්‍රාන්ත ව්‍යවස්ථාදායකවල අනුමැතිය අවශ්‍ය බව කියයි.
C - මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩුවලට සමගාමී බලතල ලබා නොදෙයි.
D - ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කර ඇත.
E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය මූලික පදනම් මූලධර්මයක් වශයෙන් සලකයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

[පස්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

● අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයෙන් දඬුවම් ලැබූ වරදකරුවකුට සමාව ප්‍රදානය කිරීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාට පමණි. | එම සමාව ප්‍රදානය කිරීමේ බලය ක්‍රියාත්මක කිරීමට පෙර ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් ලබාගත යුතු ය. | (......) |
| **27.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාගනු ලබන්නේ මැතිවරණ දිස්ත්‍රික්ක පදනම් කරගෙන ය. | ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම්, වාර්ගික සහ ආගමික සාමය මෙන් ම ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීමට පනවා ඇති නෛතික සීමාවන්ට යටත් වේ. | (......) |
| **28.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයන් අතර, සිවිල් සමාජයේ නියෝජිතයන් නැත. | (......) |
| **29.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ සැසි වාර අවසන් කිරීමේ බලය තිබෙන්නේ කථානායකවරයාට ය. | පාර්ලිමේන්තුව විසිර වූවාට පසු ජනාධිපතිවරයා විසින්, ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දිනයක් නියම කිරීම අනිවාර්ය නොවේ. | (......) |
| **30.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනය යටතේ, පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනි. | පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නම් කිරීමේ බලතල තිබෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාට ය. | (......) |

[හයවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## B කොටස

**31.** දේශපාලනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ සම්ප්‍රදාය තුනක් තිබේ. එයින් **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

**32.** ලෝකයේ දේශපාලන පක්ෂ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

**33.** දේශපාලන සහ සමාජ න්‍යාය තුළ සිවිල් සමාජය යන සංකල්පය අර්ථ හතරකින් භාවිත වේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

**34.** රාජ්‍යය යනු සමාජයේ ඇති මානව සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය යන අදහස දක්වන දේශපාලන න්‍යායික ධාරා දෙකක් දේශපාලන චින්තකයන් දෙදෙනෙකු සමඟ අනන්‍ය වී ඇත. එම ධාරා **දෙක** මොනවා ද?

(1) ..........

(2) ..........

**35.** (1) ස්ත්‍රීන් දේශපාලන ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම ප්‍රශ්න කරන්නේ දේශපාලන අධ්‍යයනයේ ඇති කවර ප්‍රවේශයෙන් ද?

..........

(2) ආර්ථික සහ සමාජ පන්ති යන සාධක මගින් දේශපාලනය තීරණය කරන බව සැලකෙන්නේ කවර දේශපාලන අධ්‍යයන ප්‍රවේශයෙන් ද?

..........

**36.** (1) නීතිය සියලු පුද්ගලයින් සඳහා එක සමාන ලෙසින් ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස අවධාරණය කරන නීතියේ ආධිපත්‍යයට (Rule of Law) අයත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය කුමක් ද?

..........

(2) ආණ්ඩුවේ බලය එක ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල භාවිත කරන මූලධර්මය කුමක් ද?

..........

[ඉත්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**37.** (1) ඉන්දියානු ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?

..............................................................................................................

(2) ප්‍රංශ ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?

..............................................................................................................

**38.** නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ න්‍යාය තුළ ආධිපත්‍ය ක්‍රම තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**39.** (1) ශ්‍රී ලංකාවේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත් වූයේ කුමන වසරේදී ද? ..................

(2) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසිවන සංශෝධනය හඳුන්වා දුන්නේ කුමන වසරේදී ද? ............

**40.** 1833 දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට සහ අධිකරණ පරිපාලනයට ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිෂන් සභාවේ සාමාජිකයන් **දෙදෙනා** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**41.** ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය යටතේ හඳුන්වා දුන් බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමය තුළ බලතල ලැයිස්තු තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**42.** රාජ්‍ය ස්වාධිපත්‍යයෙහි ඇති පැතිකඩ **දෙක** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**43.** 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉන් එකකි. අනෙක් ආයතන **දෙක** කවරේ ද?

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

[අටවැනි පිටුව බලන්න.

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**44.** (1) නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය දාහත්වැනි සියවසේ දී යුරෝපයේ අත්සන් කරන ලද සාම ගිවිසුමක් මත පදනම් විය. එම ගිවිසුම නම් කරන්න.

.......................................................................................................................

(2) කුඩා රාජ්‍යයන් ලෝකයේ මහ බලවතුන්ගෙන් අපක්ෂපාතව සිටිය යුතු ය යන මූලධර්මය අවධාරණය කළ විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශය නම් කරන්න.

.......................................................................................................................

**45.** (1) ලෝකය බල කඳවුරු දෙකකට බෙදුණු ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?

.......................................................................................................................

(2) තනි ලෝක බලවතෙකු සහිත ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?

.......................................................................................................................

**46.** ගැටුම් වැළැක්වීමේ ක්‍රම දෙකක් තිබේ. ඒවා මොනවා ද?

(1) .......................................................................................................................

(2) .......................................................................................................................

**47.** රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙයාකාර ස්වභාවයක් ගනී. ඒවා මොනවා ද?

(1) .......................................................................................................................

(2) .......................................................................................................................

**48.** (1) රාජ්‍යය රහිතව පෙර පැවති මනුෂ්‍යයන් ජීවත් වූ තත්ත්වය හැඳින්වීමට සමාජ සම්මුතිවාදී න්‍යාය භාවිත කළ සංකල්පය කුමක් ද?

.......................................................................................................................

(2) ලිබරල්වාදී දේශපාලන න්‍යායේ ආරම්භක දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.

.......................................................................................................................

**49.** (1) රාජ්‍ය වන්දනය අවධාරණය කළ විසිවන සියවසේ දේශපාලන මතවාදය කුමක් ද?

.......................................................................................................................

(2) තෝමස් හොබ්ස් විසින් රචනා කරන ලද දේශපාලන න්‍යායට අයත් කෘතිය නම් කරන්න.

.......................................................................................................................

**50.** මතවාදයක් ලෙස ජාතිකවාදය හඳුනාගත හැකි ප්‍රවේශ තුනක් තිබේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) .......................................................................................................................

(2) .......................................................................................................................

***

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

**දේශපාලන විද්‍යාව II**
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ I කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, III කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ඇති සමාජ විද්‍යාත්මක ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20)

2. (i) 'දේශපාලන මතවාද' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 05)
   (ii) දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදය විස්තර කරන්න. (ලකුණු 15)

3. (i) 'රාජ්‍යය' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 05)
   (ii) රාජ්‍යය, සමාජය තුළ ඉටු කරන භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (iii) ආණ්ඩුව රාජ්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 05)

## II කොටස

4. (i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ සිදු වූ **ආර්ථික** පරිවර්තනය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)
   (ii) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ ශ්‍රී ලංකාවෙහි සිදු වූ පරිවර්තනයෙහි තිබුණු **සමාජීය** පැතිකඩ විස්තර කරන්න. (ලකුණු 10)

5. (i) සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව සෝල්බරි ව්‍යවස්ථාවේ තිබූ විධිවිධාන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)
   (ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ විධිවිධානවල අපේක්ෂිත අරමුණු ඉටු වී දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපති ධුරයේ බලතල සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධන මඟින් සිදු කරන ලද වෙනස්කම් පෙන්වා දෙන්න.
   (i) 18වන සංශෝධනය (ලකුණු 10)
   (ii) 19වන සංශෝධනය (ලකුණු 10)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

7. (i) 'ගැටුම' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 05)
(ii) ගැටුම් වර්ගීකරණය කර ඇති ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 10)
(iii) ගැටුම් සමථන මාධ්‍යයක් ලෙස සහමන්ත්‍රණය (negotiation) යන සංකල්පය ලුහුඬින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

## III කොටස

8. ප්‍රංශයේ ඩිගොල්වාදී ආණ්ඩුක්‍රමයේ ඇති ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

9. (i) 'රාජ්‍ය ප්‍රතිපත්ති' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)
(ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේදී දේශපාලන විධායකය සහ ස්ථිර විධායකය සතු භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 15)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
(i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක
(ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
(iii) ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය ක්‍රියාධරයෝ
(iv) ඉන්දීය ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
(v) දේශපාලන පක්ෂවල කාර්යයන් (ලකුණු 10 × 2 = 20)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය: ......................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 – 3 | |
| 2 | 4 – 11 | |
| 3 | 12 – 19 | |
| 4 | 20 – 25 | |
| 5 | 26 – 30 | |
| 6 | 31 – 36 | |
| 7 | 37 – 43 | |
| 8 | 44 – 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය
(1) රාජ්‍ය පරිපාලන කටයුතුවලට සීමා වන්නකි.
(2) සැමවිට ම සමාජ සුභසාධනය පිළිබඳව සැලකිලිමත් වෙයි.
(3) මැතිවරණ ක්‍රියාදාමයට සීමා වේ.
(4) පුරවැසියන් අතර පවතින සමාජ භාවිතයකි.
(5) සමාජයේ සදාචාරාත්මක ඇගයුම් අධ්‍යයනය කිරීමකි. (......)

**2.** දේශපාලන විද්‍යාව
(1) දේශපාලන බලය ලබාගැනීම අරමුණු කර ගනියි.
(2) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට සීමා වේ.
(3) සමාජීය විද්‍යා ක්ෂේත්‍රයෙහි ශාඛාවකි.
(4) පක්ෂ දේශපාලනය අධෛර්ය කරයි.
(5) ව්‍යවහාර ඥානය මත පදනම් වේ. (......)

**3.** ව්‍යවස්ථානුකූලවාදය
(1) සංවරණ සහ තුලන මූලධර්මය යටපත් කරයි.
(2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායට එරෙහිව යයි.
(3) දූෂණ සහ බලය අපහරණය කිරීම ප්‍රවර්ධනය කරයි.
(4) විධායකය සහ ව්‍යවස්ථාදායකය තුළ රාජ්‍ය බලය ඒකරාශී වීමට හැකියාව ලබා දෙයි.
(5) පුරවැසියන්ගේ මූලික අයිතීන් සහ නිදහස සුරක්ෂිත කරයි. (......)

[ඉතිරි පිටුව බලන්න

**4.** සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
(1) සම්භවය ලැබුවේ 17වන සියවසේ දී ය.
(2) ලිබරල්වාදය සමඟ සමීපව සම්බන්ධ වී තිබිණි.
(3) බ්‍රිතාන්‍ය කොන්සර්වටිව් පක්ෂයේ දේශපාලන මතවාදය විය.
(4) ධනවාදය සහ සමාජවාදය යන දෙකෙහිම ලක්ෂණවල සංයෝගයකි.
(5) ආර්ථික අසමානතා අහෝසි කිරීමට ධනවාදයට පවතින හැකියාව විශ්වාස කළේ ය. (……)

**5.** නීතියේ ආධිපත්‍යය
(1) ආණ්ඩුවේ නිලධරතන්ත්‍රයේ ආධිපත්‍ය බලය සාධාරණය කරයි.
(2) ජාතික හදිසි අවස්ථාවල දී අත්තනෝමතිකව ක්‍රියා කිරීමේ හැකියාව ආණ්ඩුවට ලබාදෙයි.
(3) ආණ්ඩුවේ තීරණ සැමවිට ම බහුතරයේ කැමැත්ත පිළිබිඹු කළ යුතු බව අවධාරණය කරයි.
(4) දේශපාලන බලය වගවීමෙන් තොරව භාවිත කිරීම වැළැක්වීම අරමුණු කරයි.
(5) සමාජවාදයේ නෛතික සංකල්පයකි. (……)

**6.** රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරයට ඇතුළත් වන්නේ,
(1) දේශපාලන බලය ලබා ගැනීම සඳහා පමණක් මහජන ගැටලු ප්‍රයෝජනයට ගැනීමයි.
(2) රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵල පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් ලබා දීමයි.
(3) ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ ජනතා සහභාගිත්වය සීමා කිරීමයි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය මගින් පෞද්ගලික අභිලාෂ ප්‍රවර්ධනය කිරීමයි.
(5) පක්ෂ නායකත්වය ප්‍රතිපත්ති විවාදවලට සම්බන්ධ වීම අධෛර්ය කිරීමයි. (……)

**7.** ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවණතාවලට ඇතුළත් වන්නේ,
(1) සාම්ප්‍රදායික පක්ෂ මතවාද අඛණ්ඩව පවත්වාගෙන යාමයි.
(2) ජනවාර්ගික-ආගමික පක්ෂ අතුරුදහන් වීමයි.
(3) සාම්ප්‍රදායික වාමාංශික පක්ෂවල ජනප්‍රියත්වය වර්ධනය වීමයි.
(4) සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂ දෙක පිරිහීමට පත්වීමයි.
(5) පක්ෂ අභ්‍යන්තර ගැටුම් අඩු වීමයි. (……)

**8.** ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) නියෝජනය ලබා ගැනීමට කුඩා පක්ෂවලට වැඩි අවකාශ ලැබීමයි.
(2) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අඩු වීමයි.
(3) ජාතික ලැයිස්තුව හඳුන්වා දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමයි.
(4) මැතිවරණ ප්‍රචාරණය සඳහා යොදවන වියදම් අඩු වීමයි.
(5) ජනවාර්ගික අනන්‍යතාව සහිත දේශපාලන පක්ෂ බිහිවීම වැළැක්වීමයි. (……)

**9.** ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) මගින්
(1) රාජ්‍ය සේවය දේශපාලන විධායකයේ පාලනයෙන් නිදහස් කෙරිණි.
(2) රාජ්‍ය සේවකයන් පත්කිරීමේ හා මාරුකිරීමේ බලය කැබිනට් අමාත්‍යවරුන්ට පැවරිණි.
(3) රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය අහෝසි කරන ලදී.
(4) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිපාදන හඳුන්වා දෙන ලදී.
(5) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ක්‍රියාවලිය නිර්දේශපාලනීය කෙරිණි. (……)

**10.** ජාතික අභිලාෂ සාධනය කරගැනීමට ජාත්‍යන්තර දේශපාලනය තුළ ඇති මාධ්‍යයක් වන්නේ,
(1) රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ය.
(2) දේශපාලන පක්ෂ ය.
(3) බහුජාතික සමාගම් ය.
(4) ප්‍රභූ කණ්ඩායම් ය.
(5) සමාජ ව්‍යාපාර ය. (……)

**11.** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය
(1) දකුණු ආසියානු කලාපයේ රාජ්‍යවල වැදගත්කම නොසලකා හැරියේ ය.
(2) සමාජවාදී මතවාදය මගින් මෙහෙයවනු ලැබිණ.
(3) හැඩගැසුණේ බලයට පත් පාලන තන්ත්‍රවල මතවාද සහ අභිලාෂවලිනි.
(4) ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීමේ වාසිය සැමවිට ම නොසලකා හැර ඇත.
(5) එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මගින් නිශ්චය කරනු ලැබ ඇත. (……)

**12.** දේශපාලන විද්‍යාවේ චර්යාවාදී ප්‍රවේශය
(1) සම්භාව්‍ය ග්‍රීක යුගය දක්වා දිවෙන ඉතිහාසයකට හිමිකම් කියයි.
(2) ආනුභවික පර්යේෂණ සමග සම්බන්ධ විය.
(3) දේශපාලන ආයතනවල ඉතිහාසය අවධාරණය කරයි.
(4) ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයින්ගේ සහාය ලබා ගැනීමට අසමත් විය.
(5) පුද්ගල දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම නොසලකා හරියි. (......)

**13.** ආණ්ඩුව
(1) රාජ්‍යයට වඩා දිගුකාලීන පැවැත්මක් සහිත ය.
(2) සමාජයේ දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි.
(3) රාජ්‍යයේ මූලික ආයතනික නියෝජිතයා ය.
(4) ජාතියේ බාහිර ස්වාධිපත්‍යට හිමිකම් කියයි.
(5) රාජ්‍යය යන සංකල්පයට සමාන අර්ථයක් දෙයි. (......)

**14.** ඉන්දියානු නිරාගමිකවාදයෙන් අදහස් කරනුයේ,
(1) සෑම ආගමක් ම රාජ්‍ය ආගම් ලෙස සැලකීමයි.
(2) රාජ්‍යය සියලු ආගම්වලට අපක්ෂපාතව සැලකීමයි.
(3) සියලු පුරවැසියන්ගේ ජනවාර්ගික අනන්‍යතාවලට ගරු කිරීමයි.
(4) සුළුතර ආගම්වලට විශේෂ සැලකිලි දැක්වීමයි.
(5) ආගමික ඉගැන්වීම් සම්බන්ධ මතභේද විසඳීමට ආණ්ඩුව මැදිහත් වීමයි. (......)

**15.** ලිබරල්වාදය
(1) රාජ්‍යය පවතින්නේ පන්ති සහිත සමාජ තුළ බවට තර්ක කරයි.
(2) පුරවැසියන්ගේ පුද්ගලික නිදහස සුරක්ෂිත කිරීම අරමුණ කරගනියි.
(3) වෙළෙඳ කටයුතු තුළ රාජ්‍යයේ මැදිහත්වීම ප්‍රවර්ධනය කරයි.
(4) මාක්ස්වාදීන්ගේ සහයෝගය ලැබූ දේශපාලන මතවාදයකි.
(5) සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය අධෛර්යයට පත් කරයි. (......)

**16.** ස්විට්සර්ලන්තය
(1) සතු ආණ්ඩුක්‍රමය, අර්ධ සන්ධීය යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශිත ය.
(2) දියුණු සන්ධීය ක්‍රමයක් පවතින සාපේක්ෂ වශයෙන් විශාල රටකි.
(3) හවුල් පාලනයට (shared-rule) සහ ස්වයං පාලනයට (self -rule) ඉඩ සපයන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්මයක් සහිත රටකි.
(4) කැන්ටන් ඒකකවලට ස්වයං පාලන බලතල ලබා නොදෙයි.
(5) සතුව තිබෙන්නේ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි. (......)

**17.** ඇමෙරිකානු එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) බලතල වෙන්කිරීමට ඉඩ සලසන්නේ නැත.
(2) සමූහාණ්ඩුවාදය ප්‍රතික්ෂේප කොට ඇත.
(3) පෙර පැවති ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසිකොට පිහිටුවනු ලැබ ඇත.
(4) විදේශ රාජ්‍ය සමග ගිවිසුම්වලට එළැඹීමට ප්‍රාන්තවලට බලය ලබා දී ඇත.
(5) මධ්‍යම ආණ්ඩුවෙහි බලතල පමණක් දක්වා සිටියි. (......)

**18.** ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදාළ මූලධර්මය වන්නේ,
(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන්ව මැතිවරණ පැවැත්වීමයි.
(2) විධායකය එහි පැවැත්ම සඳහා ව්‍යවස්ථාදායකය මත පදනම් වීමයි.
(3) ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා නොවීමයි.
(4) විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ නිල කාලය එකවර අවසන් වීමයි.
(5) ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සාපේක්ෂ වශයෙන් පහසු ක්‍රියාදාමයක් වීමයි. (......)

**19.** වෙස්ට්මින්ස්ටර් මාදිලියේ ආණ්ඩුක්‍රමය
(1) ප්‍රංශ ආණ්ඩුක්‍රමයට සමාන වේ.
(2) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ ප්‍රතිපාදන සහිත වේ.
(3) පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය උත්තරීතර කොට සලකයි.
(4) නීති අධිකරණ විමර්ශනයට ලක් කිරීමට ඉඩ සලසයි.
(5) කැබිනට් අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීමට අවකාශ ලබා නොදෙයි. (......)

**20.** ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
(2) ආණ්ඩුකාරවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා බවට පත් කළේ ය.
(3) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක් සඳහා පදනම දැමී ය.
(4) වාර්ගික නියෝජනය ප්‍රවර්ධනය කළේ ය.
(5) ස්ත්‍රීන්ට ඡන්ද අයිතිය ලබාදීම ප්‍රතික්ෂේප කළේ ය. (……)

- අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** සෝල්බරි ව්‍යවස්ථාවේ වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ වූයේ,
A - අග්‍රාණ්ඩුකාරවරයා නාමමාත්‍ර විධායකය වීම ය.
B - දේශපාලන විධායකය පාර්ලිමේන්තුව මගින් තෝරා පත්කර ගැනීම ය.
C - ව්‍යවස්ථාදායකය ද්වි-මාණ්ඩලික වීම ය.
D - අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම ය.
E - අග්‍රාණ්ඩුකාරවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**22.** ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
A - සිවිල් සහ දේශපාලන අයිතීන් සහතික කරයි.
B - මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ඕනෑම අධිකරණයකට පෙත්සම් ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට අවස්ථාව සලසයි.
C - මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දෙයි.
D - සාමූහික සහ සමාජ අයිතීන් ඇතුළත් නොවීම නිසා විවේචනයට ලක් වේ.
E - හදිසි අවස්ථාවක් පැනවූ විට මූලික අයිතිවාසිකම් මත සීමා ඇති කරයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**23.** සාමය ගොඩනැගීම
A - බිම් මට්ටමේ සාම ප්‍රයත්න පමණක් ප්‍රවර්ධනය කරයි.
B - එක් එක් රටවල සුවිශේෂ තත්ත්වයන්ට අනුව සකස් වේ.
C - දිග්ගැස්සුණු ගැටුම් සිදුවන සමාජයන්හි තිරසර සාමය අවධාරණය කරයි.
D - පුරවැසියන් සහ සිවිල් සමාජ ව්‍යාපාරවල සහභාගිත්වය අවධාරණය කරයි.
E - සාධනීය හා නිෂේධනීය සාමය (positive and negative peace) යන දෙඅංශයෙන් ම සමන්විත වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**24.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) යටතේ පැවැති ව්‍යවස්ථාදායකය
A - අධිකරණ අධීක්ෂණයට යටත් නොවී ය.
B - රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය ලෙස සැලකිණි.
C - බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආකෘතියෙන් වෙනස් විය.
D - ද්වි මාණ්ඩලික විය.
E - නිල වශයෙන් හඳුන්වන ලද්දේ ජාතික රාජ්‍ය සභාව ලෙස ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**25.** ඇමෙරිකානු සන්ධීය ආණ්ඩු ක්‍රමය
A - ප්‍රාන්ත රාජ්‍යවල ස්වායත්තතාව යන අදහස මත පදනම් ව ගොඩනැගිණි.
B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා ප්‍රාන්ත ව්‍යවස්ථාදායකවල අනුමැතිය අවශ්‍ය බව කියයි.
C - මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩුවලට සමගාමී බලතල ලබා නොදෙයි.
D - ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කර ඇත.
E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය මූලික පදනම් මූලධර්මයක් වශයෙන් සලකයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයෙන් දඬුවම් ලැබූ වරදකරුවකුට සමාව ප්‍රදානය කිරීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාට පමණි. | එම සමාව ප්‍රදානය කිරීමේ බලය ක්‍රියාත්මක කිරීමට පෙර ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් ලබාගත යුතු ය. | (......) |
| 27. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාගනු ලබන්නේ මැතිවරණ දිස්ත්‍රික්ක පදනම් කරගෙන ය. | ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම්, වාර්ගික සහ ආගමික සාමය මෙන් ම ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීමට පනවා ඇති නෛතික සීමාවන්ට යටත් වේ. | (......) |
| 28. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයන් අතර, සිවිල් සමාජයේ නියෝජිතයන් නැත. | (......) |
| 29. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ සැසි වාර අවසන් කිරීමේ බලය තිබෙන්නේ කථානායකවරයාට ය. | පාර්ලිමේන්තුව විසිර වූවාට පසු ජනාධිපතිවරයා විසින්, ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දිනයක් නියම කිරීම අනිවාර්ය නොවේ. | (......) |
| 30. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනය යටතේ, පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනි. | පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නම් කිරීමේ බලතල තිබෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාට ය. | (......) |

AL/2021(2022)/23/S-I

## B කොටස

**31.** දේශපාලනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ සම්ප්‍රදාය තුනක් තිබේ. එයින් **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

**32.** ලෝකයේ දේශපාලන පක්ෂ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

**33.** දේශපාලන සහ සමාජ න්‍යාය තුළ සිවිල් සමාජය යන සංකල්පය අර්ථ හතරකින් භාවිත වේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

**34.** රාජ්‍යය යනු සමාජයේ ඇති මානව සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය යන අදහස දක්වන දේශපාලන න්‍යායික ධාරා දෙකක් දේශපාලන චින්තකයන් දෙදෙනෙකු සමඟ අනන්‍ය වී ඇත. එම ධාරා **දෙක** මොනවා ද?

(1) ..........

(2) ..........

**35.** (1) ස්ත්‍රීන් දේශපාලන ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම ප්‍රශ්න කරන්නේ දේශපාලන අධ්‍යයනයේ ඇති කවර ප්‍රවේශයෙන් ද?

..........

(2) ආර්ථික සහ සමාජ පන්ති යන සාධක මගින් දේශපාලනය තීරණය කරන බව සැලකෙන්නේ කවර දේශපාලන අධ්‍යයන ප්‍රවේශයෙන් ද?

..........

**36.** (1) නීතිය සියලු පුද්ගලයින් සඳහා එක සමාන ලෙසින් ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස අවධාරණය කරන නීතියේ ආධිපත්‍යයට (Rule of Law) අයත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය කුමක් ද?

..........

(2) ආණ්ඩුවේ බලය එක ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල භාවිත කරන මූලධර්මය කුමක් ද?

..........

**37.** (1) ඉන්දියානු ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?

(2) ප්‍රංශ ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?

**38.** නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ න්‍යාය තුළ ආධිපත්‍ය ක්‍රම තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1)

(2)

**39.** (1) ශ්‍රී ලංකාවේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත් වූයේ කුමන වසරේදී ද?

(2) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසිවන සංශෝධනය හඳුන්වා දුන්නේ කුමන වසරේදී ද?

**40.** 1833 දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට සහ අධිකරණ පරිපාලනයට ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිෂන් සභාවේ සාමාජිකයන් **දෙදෙනා** නම් කරන්න.

(1)

(2)

**41.** ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය යටතේ හඳුන්වා දුන් බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමය තුළ බලතල ලැයිස්තු තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1)

(2)

**42.** රාජ්‍ය ස්වාධිපත්‍යයෙහි ඇති පැතිකඩ **දෙක** නම් කරන්න.

(1)

(2)

**43.** 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉන් එකකි. අනෙක් ආයතන **දෙක** කවරේ ද?

(1)

(2)

44. (1) නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය දාහත්වැනි සියවසේ දී යුරෝපයේ අත්සන් කරන ලද සාම ගිවිසුමක් මත පදනම් විය. එම ගිවිසුම නම් කරන්න.

.............................................................................................................

(2) කුඩා රාජ්‍යයන් ලෝකයේ මහ බලවතුන්ගෙන් අපක්ෂපාතව සිටිය යුතු ය යන මූලධර්මය අවධාරණය කළ විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශය නම් කරන්න.

.............................................................................................................

45. (1) ලෝකය බල කඳවුරු දෙකකට බෙදුණු ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?

.............................................................................................................

(2) තනි ලෝක බලවතෙකු සහිත ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?

.............................................................................................................

46. ගැටුම් වැළැක්වීමේ ක්‍රම දෙකක් තිබේ. ඒවා මොනවා ද?

(1) .............................................................................................................

(2) .............................................................................................................

47. රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙයාකාර ස්වභාවයක් ගනී. ඒවා මොනවා ද?

(1) .............................................................................................................

(2) .............................................................................................................

48. (1) රාජ්‍යය රහිතව පෙර පැවති මනුෂ්‍යයන් ජීවත් වූ තත්ත්වය හැඳින්වීමට සමාජ සම්මුතිවාදී න්‍යාය භාවිත කළ සංකල්පය කුමක් ද?

.............................................................................................................

(2) ලිබරල්වාදී දේශපාලන න්‍යායේ ආරම්භක දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.

.............................................................................................................

49. (1) රාජ්‍ය චන්දනය අවධාරණය කළ විසිවන සියවසේ දේශපාලන මතවාදය කුමක් ද?

.............................................................................................................

(2) තෝමස් හොබ්ස් විසින් රචනා කරන ලද දේශපාලන න්‍යායට අයත් කෘතිය නම් කරන්න.

.............................................................................................................

50. මතවාදයක් ලෙස ජාතිකවාදය හඳුනාගත හැකි ප්‍රවේශ තුනක් තිබේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) .............................................................................................................

(2) .............................................................................................................

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂය අංකය
பாட இலக்கம் 23

විෂයය
பாடம் දේශපාලන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 1 |
| 02. | 3 | 12. | 2 | 22. | 4 |
| 03. | 5 | 13. | 3 | 23. | 5 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 |
| 05. | 4 | 15. | 2 | 25. | 3 |
| 06. | 2 | 16. | 3 | 26. | 2 |
| 07. | 4 | 17. | 5 | 27. | 1 |
| 08. | 1 | 18. | 1 | 28. | 5 |
| 09. | 2 | 19. | 3 | 29. | 4 |
| 10. | 1 | 20. | 3 | 30. | 3 |

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்
අවසාන ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60

# B කොටස කෙටි පිළිතුරු (සංශෝධිත)

**31. දේශපාලනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ සම්ප්‍රදාය තුනක් තිබේ. එයින් දෙකක් නම් කරන්න.**

I. සම්භාව්‍ය තුලනාත්මක

II. 20 වැනි සියවසේ තුලනාත්මක

III. සමකාලීන

**32. ලෝකයේ දේශපාලන පක්ෂ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. තනි පක්ෂ ක්‍රමය / ඒක පක්ෂ ක්‍රමය
II. ද්වි පක්ෂ ක්‍රමය
III. අධිපති තනි පක්ෂ ක්‍රමය / අධිපති ඒක පක්ෂ ක්‍රමය
IV. අධිපති ද්වි පක්ෂ ක්‍රමය
V. බහු පක්ෂ ක්‍රමය

**33. දේශපාලන සහ සමාජ න්‍යාය තුළ සිවිල් සමාජය යන සංකල්පය අර්ථ හතරකින් භාවිත වේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය
II. සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය
III. සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය
IV. නව මාක්ස්වාදී ග්‍රාම්ෂියානු අර්ථය

**34. රාජ්‍යය යනු සමාජයේ ඇති මානව සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය යන අදහස දක්වන දේශපාලන න්‍යායික ධාරා දෙකක් දේශපාලන චින්තකයන් දෙදෙනෙකු සමඟ අනන්‍ය වී ඇත. එම ධාරා දෙක මොනවා ද?**

I. ඇරිස්ටෝටලියානු අර්ථය - ඇරිස්ටෝටල්
II. වෙබේරියානු අර්ථය - මැක්ස් වේබර්

**35. (1) ස්ත්‍රීන් දේශපාලන ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම ප්‍රශ්න කරන්නේ දේශපාලන අධ්‍යයනයේ ඇති කවර ප්‍රවේශයෙන් ද?**

ස්ත්‍රීවාදී ප්‍රවේශය/ ස්ත්‍රීවාදය

**(2) ආර්ථික සහ සමාජ පන්ති යන සාධක මගින් දේශපාලනය තීරණය කරන බව සැලකෙන්නේ කවර දේශපාලන අධ්‍යයන ප්‍රවේශයෙන් ද?**

මාක්ස්වාදී ප්‍රවේශය/දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය/ ඓතිහාසික භෞතිකවාදය / සමාජවාදී ප්‍රවේශය

**36. (1) නීතිය සියලු පුද්ගලයින් සඳහා එක සමාන ලෙසින් ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස අවධාරණය කරන නීතියේ ආධිපත්‍යයට (Rule of Law) අයත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය කුමක් ද?**

නීතිය ඉදිරියේ සමානත්වය/ නීතිය පාලකයාට හා පලිතයාට එක සමානව ක්‍රියාත්මක කිරීම

**(2) ආණ්ඩුවේ බලය එක ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල භාවිත කරන මූලධර්මය කුමක් ද?**

බලතල වෙන් කිරීම/ බලතල බෙදීම / බලතල පංගු කිරීම

**37. (1) ඉන්දියානු ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?**

අර්ධ - සන්ධීය මාදිලිය

**(2) ප්‍රංශ ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?**

ඒකීය/ ඒකීය මධ්‍යගත

**38. නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ න්‍යාය තුළ ආධිපත්‍ය ක්‍රම තුනක් තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. සාම්ප්‍රදායික
II. අනුහස් හෙවත් කැරිස්මාවාදී
III. නෛතික - තාර්කික

**39. (1) ශ්‍රී ලංකාවේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත් වූයේ කුමන වසරේදී ද?**

1956

**(2) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසිවන සංශෝධනය හඳුන්වා දුන්නේ කුමන වසරේදී ද?**

2020

**40. 1833 දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට සහ අධිකරණ පරිපාලනයට ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනා නම් කරන්න.**

I. කෝල්බෘක්, විලියම් කෝල්බෘක්
II. කැමරන්, චාල්ස් කැමරන්, සී.එච්.කැමරන්

**41. ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය යටතේ හඳුන්වා දුන් බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමය තුළ බලතල ලැයිස්තු තුනක් තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. පළාත් සභා ලැයිස්තුව
II. සමගාමී ලැයිස්තුව
III. මධ්‍යම ලැයිස්තුව/ සංචෘත ලැයිස්තුව

**42. රාජ්‍ය ස්වාධිපත්‍යයෙහි ඇති පැතිකඩ දෙක නම් කරන්න.**

I. අභ්‍යන්තර ස්වාධිපත්‍යය
II. බාහිර ස්වාධිපත්‍යය

**43. 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉන් එකකි. අනෙක් ආයතන දෙක කවරේ ද?**

I. අග්‍රාණ්ඩුකාරවරයා/ රැජිණ/ බ්‍රිතාන්‍ය කිරීටය
II. සෙනේට් සභාව/ උත්තර මන්ත්‍රී මණ්ඩලය/ දෙවැනි මණ්ඩලය/ ඉහළ මණ්ඩලය

**44. (1) නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය දාහත්වැනි සියවසේ දී යුරෝපයේ අත්සන් කරන ලද සාම ගිවිසුමක් මත පදනම් විය. එම ගිවිසුම නම් කරන්න.**

වෙස්ට්ෆේලියානු ගිවිසුම

**(2) කුඩා රාජ්‍යයන් ලෝකයේ මහ බලවතුන්ගෙන් අපක්ෂපාතව සිටිය යුතු ය යන මූලධර්මය අවධාරණය කළ විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශය නම් කරන්න.**

නොබැඳි පිළිවෙත

**45. (1) ලෝකය බල කඳවුරු දෙකකට බෙදුණු ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?**

ද්වි ද්‍රැවීය ලෝක ක්‍රමය, ද්වි බල ද්‍රැවීය ලෝක ක්‍රමය

**(2) තනි ලෝක බලවතෙකු සහිත ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?**

ඒක ද්‍රැවීය ලෝක ක්‍රමය, ඒක බල ද්‍රැවීය ලෝක ක්‍රමය

**46. ගැටුම් වැළැක්වීමේ ක්‍රම දෙකක් තිබේ. ඒවා මොනවා ද?**

I. සරළ වැළැක්වීම
II. ගැඹුරු වැළැක්වීම

**47. රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙයාකාර ස්වභාවයක් ගනී. ඒවා මොනවා ද?**

I. ප්‍රතිපත්ති සම්බන්ධ හැදෑරීම
II. ප්‍රතිපත්ති තුළ හැදෑරීම

**48. (1) රාජ්‍යය රහිතව පෙර පැවති මනුෂ්‍යයන් ජීවත් වූ තත්ත්වය හැඳින්වීමට සමාජ සම්මුතිවාදී න්‍යාය භාවිත කළ සංකල්පය කුමක් ද?**

ස්වාභාවික තත්වය/ ප්‍රකෘති තත්වය/ පූර්ව - රාජ්‍ය තත්වය

**(2) ලිබරල්වාදී දේශපාලන න්‍යායේ ආරම්භක දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.**

ජෝන් ලොක්, ලොක්

**49. (1) රාජ්‍ය වන්දනය අවධාරණය කළ විසිවන සියවසේ දේශපාලන මතවාදය කුමක් ද?**

නට්සිවාදය/ ෆැසිස්ට් වාදය/ නාසිවාදය

**(2) තෝමස් හොබ්ස් විසින් රචනා කරන ලද දේශපාලන න්‍යායට අයත් කෘතිය නම් කරන්න.**

**50. මතවාදයක් ලෙස ජාතිකවාදය හඳුනාගත හැකි ප්‍රවේශ තුනක් තිබේ. ඉන් දෙකක් නම් කරන්න.**

I. චිරන්තනවාදී
II. නූතනවාදී
III. මෙවළම්වාදී / උපකරණවාදී

# I කොටස

**1. දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ඇති සමාජ විද්‍යාත්මක ප්‍රවේශය විස්තර කරන්න.**

**හැඳින්වීම**

- දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ප්‍රවේශ කිහිපයක් තිබේ. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය එයින් එකකි.
- දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යාව එකිනෙකට ළඟින් සම්බන්ධ ශාස්ත්‍රීය විෂය දෙකක් නිසා ඒවා අතර දිගටම පවතින්නේ කිට්ටු සම්බන්ධයකි.
- දේශපාලන සමාජ විද්‍යාව නම් උප ක්ෂේත්‍රය, දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍ර දෙකටම සම්බන්ධය.

**අන්තර්ගතය**

- දේශපාලන විද්‍යා ගවේෂණය, සමාජ විද්‍යා විධික්‍රම නිසා පෝෂණය වී ඇත.
- ඕගස්ත් කොම්ත්, කාල් මාක්ස් සහ මැක්ස් වේබර් යන දහනව වැනි සියවසෙහි සිටි සමාජ න්‍යායධරයයෝ මෙම ප්‍රවේශයෙහි පුරෝගාමීහු වූහ.
- විසි වැනි සියවසෙහි මැද භාගයෙහි දී සමාජ පර්යේෂණ පිළිබඳ ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලයේ න්‍යායධරයෝ මෙම ප්‍රවේශයේ නූතන පුරෝගාමීහු වූහ.
- නූතන දේශපාලන විද්‍යා විධි ක්‍රමය සමාජ විද්‍යාව සහ මානව විද්‍යාව යන විෂය දෙකෙන්ම අභාසය ලබා ඇත.
- සමාජ විද්‍යා ගවේෂණය අවබෝධකර ගැනීමට අපේක්ෂා කරන්නේ සමාජ ව්‍යූහයන්, සමාජ සංවිධාන, සමාජ ඒකක, මනුෂ්‍යයින් සහ සමාජය අතර සම්බන්ධය, සමාජ ස්ථරායණය සහ සමාජ පරිවර්තනය යනාදී තේමාය.
- පහත සඳහන් ආකාරයේ තේමා පිළිබඳව පුළුල් අවබෝධයක් ඇති කර ගැනීමට දේශපාලන විද්‍යාඥයින්ට සමාජ විද්‍යා ප්‍රවේශය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. දේශපාලන පක්ෂ සහ ඒවායේ සමාජ පදනම්, පුරවැසියන්ගේ ඡන්ද චර්යාව, දේශපාලනයට බලපාන සමාජ ගැටුම්, දේශපාලනයේ සමාජ සහ පන්ති පදනම් සහ පන්ති අරගලය.
- දේශපාලනය පිළිබඳ සමාජ විද්‍යා ප්‍රවේශය පිළිතුරු සොයන්නට උත්සාහ ගන්නේ පහත සඳහන් ආකාරයේ ප්‍රශ්නවලට ය. පුරවැසියන් දේශපාලනයට සහභාගී වන්නේ ඇයි? සමාජයේ දේශපාලන බලය ඇත්තටම දරන්නේ කවර සමාජ කොටසක් හෝ සමාජ පන්තිද? ධනය, කුලය, පන්තිය, පවුල, ස්ත්‍රී පුරුෂ භාවය වැනි සාධක පුරවැසියන්ගේ දේශපාලන සහභාගීත්වයට බලපාන්නේ කවර ආකාරයෙන් ද? දේශපාලන පක්ෂ නියෝජනය කරන්නේකවර දේශපාලන

**නිගමනය**

- සමාජ විද්‍යාත්මක ප්‍රවේශයෙන් ලැබෙන ප්‍රයෝජනය සහ එහි සීමා ගැන සඳහන් කරමින් පිළිතුර අවසන් කළ හැකිය.
- දේශපාලනය ඇත්ත වශයෙන්ම සිදුවන සමාජය වෙතට යෑමට එම ප්‍රවේශය දේශපාලන විද්‍යාඥයින්ට හැකියාව ලබා දෙයි.

- දේශපාලන විද්‍යාවේ ඇති සුවිශේෂී අනන්‍යතාව, සමාජ විද්‍යා ප්‍රවේශය නිසා සීමා වීම, එම ප්‍රවේශයේ ඇති එක් සීමාවකි. සමාජ විද්‍යා සාධක වලට වැඩි අවධානය යොමු කිරීම එයට හේතුවයි.

**2. (i) 'දේශපාලන මතවාද' යන සංකල්පය අර්ථ දක්වන්න.**

- දේශපාලන මතවාදවලට දීර්ඝ ඉතිහාසයක් පවතියි.
- දේශපාලන මතවාද යන වචනය භාවිතයට පැමිණියේ 18 වන සියවසේදී ය.
- කාර්මික විප්ලවයක් සමඟ බටහිර යුරෝපයේ සිදු වූ සමාජ, ආර්ථික සහ දේශපාලන පරිවර්තනයට සමගාමීව නූතන දේශපාලන මතවාද බිහිවිය.
- දේශපාලන මතවාදයක්,
    - ➢ සමාජයේ දේශපාලනයට බලපෑම් කරයි.
    - ➢ දේශපාලන ක්‍රියාකාරීත්වයට සහ දේශපාලන පරිවර්තනයට මඟ පෙන්වයි.
    - ➢ සමාජයේ විශාල ජන කොටසක් ආකර්ෂණය කර ගැනීමට සමත් වේ.
    - ➢ දේශපාලන මතිමතාන්තර සහ විශ්වාස ආදියෙන් සමන්විත නිශ්චිත අදහස් සමුච්චයකි.
- ඕනෑම දේශපාලන මතවාදයක පොදු ලක්ෂණ
    - ➢ එකිනෙකා ට සංගත වූ අදහස් මාලාවකින් සමන්විත වේ.
    - ➢ සමාජයේ යම් යම් කොටස්වල දේශපාලන විඥානය, විශ්වාස සහ ඉදිරි දැක්ම හැඩ ගැස්වීමට ද සමත් වේ.
- සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු කිරීමේ හැකියාව ද සහිතය.
    - ➢ මෙයට නිදසුන් ලෙස ලිබරල්වාදය, ජාතිකවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, ෆැසිස්ට්වාදය, රාජ්‍ය සුභසාධනවාදය, නව ලිබරල්වාදය යන මේවා නිදසුන් ලෙස දැක්විය හැක.

**(ii) දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදය විස්තර කරන්න.**

**හැඳින්වීම**

'සමාජවාදය' පිළිබඳ අදහස යුරෝපයේ 19 වැනි සියවසේ මුල් කාලයේ සිට මතු වී තිබිණ. පොදු දේපළ අයිතිය සහ සමාජ සමානාත්මතාව එහි මූලික මූල ධර්ම වේ.

- 19 වැනි සියවසේ දෙවන භාගයේ ආරම්භ වූ මාක්ස්වාදී සමාජවාදය විසිවැනි සියවසේ දී ප්‍රබල දේශපාලන මතවාදයක් ලෙස පැතිරිණි.
- එය ලිබරල්වාදයට සහ ධනවාදයට විවේචනයක් මෙන්ම විකල්පයක් ද විය.

ග

ආර්ථික සමාජ අසමානත්වය තුරන් කිරීමය. එසේම දේපළවල පොදු සමාජීය අයිතිය වෙනුවෙන් ද එය පෙනී සිටියේ ය.

- සමාජවාදය ප්‍රබල මතවාදයක් බවට පත් කරන ලද්දේ මාක්ස්වාදය විසිනි.

**අන්තර්ගතය**

- සමාජවාදය යන අදහස මතුවන අවධි දෙකක් හඳුනා ගත හැකිවේ.

I. ධනවාදී ක්‍රමය යටතේ පැවති පෞද්ගලික දේපළ ක්‍රමය වෙනුවට පොදු දේපළ ක්‍රමයක් පිළිබඳ විකල්පයක් ඉදිරිපත් කිරීම.

II. කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් විසින් මාක්ස්වාදය නමින් සමාජවාදය පිළිබඳ නව මතවාදයක් ඉදිරිපත් කිරීම. මෙය විද්‍යාත්මක සමාජවාදය යනුවෙන් හැඳින්වේ.

- 1848 දී ප්‍රකාශයට පත් කළ 'කොමියුනිස්ට් ප්‍රකාශනය' මඟින් කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් විසින් සමාජවාදය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය ඉදිරිපත් කරන ලදි.

- සමාජවාදයේ මතවාදී අන්තර්ගතය;

I. ධනවාදී පෞද්ගලික දේපළ ක්‍රමය වෙනුවට සාමූහික අයිතිය පදනම් කරගත් පොදු දේපළ ක්‍රමයක් ඇති කිරීම.

II. පන්ති විරහිත සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම.

III. සමාජ වාදයට අනුව රාජ්‍යය ක්‍රියාත්මක වූයේ නිෂ්පාදන මාර්ගවලට හිමිකම් කියන අතලොස්සක් වූ සමාජ පන්තියේ අභිලාෂ වෙනුවෙනි.

IV. සමාජවාදී න්‍යාය රාජ්‍යය හඳුනා ගන්නේ නිෂ්පාදන මාර්ගවලට හිමිකමක් නැති බහුතර ජනතාව සූරාකෑම සඳහා පවතින දේශපාලන ආයතනයක් ලෙසයි.

V. පීඩාකාරී උපකරණයක් වූ රාජ්‍ය යාන්ත්‍රණය අහෝසි කර දැමීම, රාජ්‍යය පිළිබඳ සමාජවාදී මතවාදයෙන් අවධාරණය කෙරේ.

VI. සෑම මනුෂ්‍යයෙකුටම සමානාත්මතාවයකින් සහ නිදහසින් යුතුව ජීවත් වීමට අවශ්‍ය සමාජ, ආර්ථික වටපිටාව සැකසීම, සමාජවාදී දෘෂ්ටියේ මූලික අරමුණයි.

- විසි වැනි සියවසේ දී සමාජවාදය ප්‍රබල දේශපාලන දෘෂ්ටියක් බවට පරිවර්තනය විය.

- විප්ලවවාදී සමාජවාදයට සමාන්තරව තුන්වැනි ලෝකයේ සමාජවාදී ධාරා කිහිපයක් ද ගොඩ නැගිණ.

**නිගමනය**

- දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදයේ ඇති විශේෂත්වය දැක්වීම.
- සමාජවාදය පන්ති බෙදීම සහ ඒ මත පදනම් වන රාජ්‍යය අහෝසි කිරීම අවධාරණය කරයි.
- සමාජවාදී සමාජයක ඊළඟ අවධිය කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය කිරීම බව සමාජවාදීහු

- සමාජ සහ ආර්ථික සමානාත්මතාවය පිළිබඳව අවධාරණය කරන එකම දේශපාලන මතවාදය සමාජවාදයයි.

**3. (i) 'රාජ්‍යය' යන සංකල්පය අර්ථ දක්වන්න.**

- රාජ්‍යය යනු ඓතිහාසික සහ සමාජීය ප්‍රපංචයකි.
- රාජ්‍යයේ ස්වභාවය සමාජයේ ඓතිහාසික වර්ධනයන්ට අනුකූලව වෙනස් වී ඇත.
- ගෝත්‍රික රාජ්‍යයේ සිට නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය තෙක් රාජ්‍යයේ ඓතිහාසික විකාශනය සිදුවී තිබේ.

- නූතන භෞමික රාජ්‍යය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධාන ගත කොට තිබේ.
  I. නිශ්චිත දේශ සීමාව
  II. ජාතික පදනම
  III. ආණ්ඩුව
  IV. ස්වාධිපත්‍යය

**(ii) රාජ්‍යය, සමාජය තුළ ඉටු කරන භූමිකාව පැහැදිලි කරන්න.**

**හැඳින්වීම**

- රාජ්‍යය සහ සමාජය අතර නොබිඳිය හැකි සම්බන්ධතාවක් පවතී.
- රාජ්‍යයකින් තොරව සංවිධානාත්මක සමාජයක් පවත්වා ගෙන යා නොහැකි ය.
- සමාජයෙහි පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය රාජ්‍යයයි.

**අන්තර්ගතය**

- රාජ්‍යය සමාජයක් පාලනය කිරීමට නිර්මානය වූ බල ව්‍යුහවල සහ ආයතනවල එකතුවකි.
- රාජ්‍යයේ භූමිකාව පුළුල් සහ සංකීර්ණ වේ.
- රාජ්‍යය සමාජය තුළ ඉටු කරන භූමිකාව පහත සඳහන් පරිදි දැක්විය හැකිය.
  I. නීතියේ, සමාජ පර්යායේ සහ දේපළවල භාරකාරත්වය.
  II. ආර්ථික පරිපාලනය සහ මෙහෙය වීම.
  III. සමාජ පාලනය, මෙහෙයවීම සහ සමාජ අධීක්ෂණය.
  IV. සමාජයේ නීතිය සහ සාමය පවත්වා ගැනීම.
  V. යුද්ධ ප්‍රකාශ කිරීම සහ යුද්ධ කිරීම.
- රාජ්‍යය සමාජයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි.

  සමාජයක පැවතිය හැකි තත්ත්වය පිළිබඳ පරිකල්පනය කරන විටදී ය.
- සමාජයක සංවිධානාත්මක පැවැත්ම, ඒකාග්‍රතාව, සුරක්ෂිතතාව සහ සමාජ යහපැවැත්ම ආදිය සඳහා රාජ්‍යයේ පැවැත්ම අත්‍යවශ්‍ය වේ.

**(iii) ආණ්ඩුව රාජ්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ ද?**

- රාජ්‍යය සහ ආණ්ඩුව එකිනෙකට සම්බන්ධ වුවත්, ඒ දෙක එකක් ම නොවේ.
- රාජ්‍යය ස්ථිර ආයතනයක් වන අතර ආණ්ඩුව කලින් කලට වෙනස්වීමේ ලක්ෂණ සහිතය.
- පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම වල රාජ්‍ය සහ ආණ්ඩුව අතර වෙනසක් නොපැවතිණි.
- ආණ්ඩුව යනු රාජ්‍යය සමන්විත වී තිබෙන ප්‍රධාන සාධකවලින් එක් සාධකයක් පමණි.
- රාජ්‍යයේ ස්වාධිපත්‍යය ක්‍රියාත්මක කරන සංවිධානය ආණ්ඩුව වේ.
- ආණ්ඩුවකින් නියෝජනය වන්නේ එක් විශේෂිත දේශපාලන මතවාදයක් හෝ දේශපාලන පක්ෂයක හෝ පක්ෂ සන්ධානයක අභිලාෂ වන අතර, රාජ්‍යයෙන් ප්‍රතිමූර්තිමත් කෙරෙන්නේ පොදු ඉලක්ක සහ පොදු පරමාදර්ශයන් ය.

## II කොටස

**4. (i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ සිදු වූ ආර්ථික පරිවර්තනය කෙටියෙන් සාකච්ඡා කරන්න.**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය යන්නනේ අදහස් කරන්නේ 1796 - 1948 අතර කාල වකවානුවයි. මේ අවධිය තුල ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනය කෙරෙහි පුළුල් ලෙස බලපෑම් කළ කාලයකි. මෙය 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ කාලයත් 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ කාලයත් කාලයද විය. මූලික වශයෙන් මෙම ප්‍රතිසංස්කරණ දෙක යටතේ මෙරට සිදු වූ ආර්ථික සහ සමාජ පරිවර්තනයන් පහත සඳහන් අන්දමට දැක්විය හැකි ය.

- රජයේ වෙළඳ අධිකාරය අහෝසි කිරීම සහ ලිබරල් ධනවාදී ආර්ථික ක්‍රමයට පදනම් වැටීම.
- දේශීය නිෂ්පාදන විදේශිය වෙළඳ පලට යැවීමත් විදේශීය නිෂ්පාදන වලට ලාංකික සමාජය හුරුවීමත් හේතුවෙන් ලාංකික සමාජය විදේශිය වෙළඳපලේ බලපෑමට ලක් වීම.
- නූතන ධනේශ්වර ආර්ථිකයට අවශ්‍ය පදනම සකස් වීම සහ වෙළඳ වැවිලි හා ආයාත - නිර්යාත ආර්ථිකය මත පදනම් වූ යටත් විජිත ධනවාදී ආර්ථිකයක් නිර්මාණය වීම. ඒ වන

දේසි

යුගයෙන් ආරම්භ වූ සීමිත වාණිජ ආර්ථිකයකි.

- රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා නිදහස් ශ්‍රම වෙළඳපළක් බිහිවීමට පදනම වැටීම.
- දේශීය ව්‍යවසායක පන්තියක් බිහිවීම, වෙළදාම හා කම්කරු හා ප්‍රවාහන කොන්ත්‍රාත් පතල් කර්මාන්තයත්, අරක්කු රේන්ද ගැනීමත් ඔවුන්ගේ ආරම්භක ව්‍යාපාරික කටයුතු විය.
- ශ්‍රී ලංකාව ප්‍රාථමික කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු ලෙස ලෝක ධනවාදි ආර්ථිකය සමග සම්බන්ධ වීම.

- ප්‍රාග්ධනය සම්පාදනය සඳහා වානිජ බැංකු ක්‍රමයක් ආරම්භ කිරීම.
- වානිජ ධනපති පන්තිය පදනම් කොට ගෙන සහ වතු වගාවේ පැතිරීමත් සමග දේශීය ධනපති පන්තියක් බිහිවීම.
- වතු වැවිලි ආර්ථිකයේ අභිවෘද්ධිය උදෙසා දේශීය, විදේශීය ආයෝජකයන් දිරි ගැන්වීම අරමුණු කරගත් ප්‍රතිපත්ති නිර්මාණය වීම.
- වරාය, දුම්රිය මාර්ග, මහාමාර්ග, සන්නිවේදන යනාදි ක්ෂේත්‍රවල දියුණුව.
- ආනයන අපනයන ආර්ථිකයක් ඇති වීම සහ ලංකාවේ ආර්ථිකය ලෝක ධනවාදී වෙළඳපොළ සමඟ සම්බන්ධ වීම.
- විදේශ වෙළඳපළ මුල්කරගත් වැවිලි ආර්ථිකයකින් සහ දේශිය වෙළඳපළ මුල්කරගත් යැපුම් ආර්ථිකයකින් සමන්විත ද්විත්ව ආර්ථිකයක් ඇති වීම.
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් හඳුන්වා දෙන ලද නිර්බාධවාදි ධනවාදී ක්‍රමයෙන් සුභසාධක රාජ්‍ය ක්‍රමය මාරුවීමත් සමග 1930 ගණන් වලදී නූතන සුභසාධක රාජ්‍ය ක්‍රමයකට පදනම සකස් වීම
- ඩොනමෝර් රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේ දී ගොවිජනපද ව්‍යාපාර ආරම්භ කිරීම

**(ii) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ ශ්‍රී ලංකාවෙහි සිදු වූ පරිවර්තනයෙහි තිබුණු සමාජීය පැතිකඩ විස්තර කරන්න.**

- රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ඇතුළුව වැඩවසම්වාදය අහෝසි කිරීමට ක්‍රියා කිරීමේ ප්‍රතිපලයක් ලෙසින් සමාජයේ පැවති කුල ව්‍යුහය දුර්වල සහ වෙනස් වීම.
- වතුවගාවට ප්‍රමුඛත්වය දීමේ ප්‍රතිඵලය ලෙස දේශිය කෘෂිකර්මාන්තය රජයේ අවධානයෙන් ගිළිහී යාම.
- ආර්ථික රටාව වෙනස් වීම හේතුවෙන් පැරණි වැඩවසම් රටාව යටතේ දක්නට ලැබුණු පාරම්පරික සමාජ බෙදීම් ක්‍රමයෙන් අහෝසි වීම, සහ නව පන්ති ව්‍යුහයක් නිර්මාණය වීම. දේශීය ධනපති පන්තිය, කම්කරු පන්තිය සහ නාගරික මධ්‍යම පන්තිය, මෙලෙස බිහි වූ ප්‍රධාන නව සමාජ පන්ති තුනයි.
- නාගරීකරණය නිසා බටහිර සංස්කෘතියට හැඩ ගැසුණු නාගරික මධ්‍යම පන්තියක් බිහි වීම.
- සමාජ ව්‍යුහයේ සංචලතා ක්‍රියාවලියට පදනම වැටීම.
- සාමාන්‍ය ජනතාව අතර ගොවි පන්තීන්ට අමතරව වතු කම්කරු සහ නාගරික නිර්ධන පන්තියක් බිහිවීම.
- බටහිර සංස්කෘතික බලපෑම්වලට ලාංකික සමාජය ක්‍රමයෙන් නතුවීම.

- කෝල්බෲක් පාලන ක්‍රමය යටතේ ඇරඹුණු සමාජ පරිවර්තන ක්‍රියාවලිය තවදුරත් පුළුල් වෙමින් වර්ධනය වීම විසි වැනි සියවසේ මුල් භාගයේදී සිදුවිය.

**නිගමනය**

- බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ඇති වූ සමාජ පරිවර්තන, ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ වල ප්‍රතිඵලයක් විය. එයට ප්‍රධාන සාධකයක් වූයේ යටත් විජිත ධනවාදී ක්‍රමයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමයි.
- යුරෝපීය සංස්කෘතිය පැතිරීම ද මෙම ක්‍රියාවලියට දායක විය.
- දේශීය සමාජයේ ප්‍රභූ පන්තීන් මෙම පරිවර්තනයෙන් ප්‍රතිලාභ ලැබුව ද, සාමාන්‍ය ජනතාවගෙන් අති බහුතරයට එවැනි ප්‍රතිලාභ නොලැබිණි.

**5. (i) සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව සෝල්බරි ව්‍යවස්ථාවේ තිබූ විධිවිධාන කෙටියෙන් විස්තර කරන්න.**

**හැඳින්වීම**

සෝල්බරි ව්‍යවස්ථාව මගින් සුළුතර ජනකොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරබයා විධිවිධාන යොදනු ලැබූයේ රටේ බහුතර ජන කණ්ඩායමට, සීමා නොවන ආකාරයේ පාලන බලයක් ලැබුනහොත් ඒ බලය සුළුතර කණ්ඩායම්වලට අවාසිවන පරිදි යෙදවිය හැකිය යන කරුණ සැළකිල්ලට ගැනීම හේතු කොටගෙන ය. මේ අනුව සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ අරමුණෙන් විධිවිධාන කිහිපයක් ම සෝල්බරි ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලදි.

- 29 (1) වගන්තිය. මෙය සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පැවති ප්‍රබලතම ව්‍යවස්ථා විධිවිධානය විය. මේ වගන්තියේ සඳහන් විධිවිධාන වලින් අපේක්ෂා කළේ වාර්ගික හෝ ආගමික පදනම මත වෙනස්කම් සිදු කරන නීති පැණවීම වැළැක්වීමටය.
- බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය. මෙම ඡන්ද කොට්ඨාශ පිහිටුවීමෙන් සෝල්බරි කොමිසම අපේක්ෂා කළේ ඇතැම් ප්‍රදේශවල ප්‍රධාන ජනවර්ගය සමග මිශ්‍රව සිටින සුළුජාතීන්ට පාර්ලිමේන්තු නියෝජනයක් සැපයීමයි.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නාමකරණයෙන් සාමාජිකයන් සය දෙනෙකු පත් කිරීම. මෙම විධිවිධානය යොදන ලද්දේ මහමැතිවරණයකින් ප්‍රමාණවත් නියෝජනයක් ලබා ගැනීමට නො හැකි වූ කිසියම් ජන කොටසක් වේ නම් ඔවුනට නියෝජනයක් ලබා දීම සඳහා ය.
- සෙනේට් මණ්ඩලය පිහිටුවීම. නිසි නියෝජනයක් නොලැබූ සුළු ජන කොටස් සෙනේට් මණ්ඩලය තුල නියෝජනය වීමට අවස්ථාව සළසා දීම මගින් සුළු ජන කොටස්වල අපේක්ෂා ආරක්ෂා කරගත හැකි වේය යන විශ්වාසයක් සෝල්බරි කොමිසම ට තිබිණි.
- ස්වාධීන රාජ්‍ය සේවා කොමිසන් සභාව

ක්‍රියාමාර්ග ය.

**(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ විධිවිධානවල අපේක්ෂිත අරමුණු ඉටු වී දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.**

සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් සුළු වාර්ගික ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධිවිධාන එම ව්‍යවස්ථා සම්පාදකයන් අපේක්ෂා කළ අන්දමට ඉටු නොවූ බව සඳහන් කල හැකි ය.

- 29 (1) වගන්තිය සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යවස්ථා විධිවිධානයක් ලෙස සැළකිය නොහැකි ය. මෙහි දර්ශන පථය සහ අභිප්‍රාය සීමා වූ අතර එහි නෛතික තත්වය අපැහැදිලි එකක් විය.

- සෙනේට් මණ්ඩලය පිහිටු වීමට මුල් වූ අරමුණු වලින් එකක් වූයේ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වුව ද, එම මණ්ඩලයට නියෝජිතයන් පත් වූ ආකාරය අනුවත් එයට හිමි වූ බලතල වල ස්වභාවය අනුවත් මේ අරමුණ සෝල්බරි කොමිසම අපේක්ෂා කළ ආකාරයට ඉටු වූයේ නැත.
  අගමැතිවරයා විසින් සුළු ජාතිකයන් වෙනුවෙන් සෙනේට් සභිකයන් පත් කිරීමේ දී ඔවුන්ගේ සුළු ජන පදනම සැළකිල්ලට ලක් කළ ද ඒ කරුණට ඉහළින් ඔවුන්ගේ දේශපාලන පක්ෂ පදනම සැළකිල්ලට ගත් බව පෙනෙන්නට තිබුණි. එබැවින් ඔවුහු බොහෝ විට ඔවුන් නියෝජනය කළ සුළු ජන පදනම අමතක කර අගමැතිවරයාගේ පක්ෂයට ලැදි පිරිසක් ලෙස ක්‍රියා කළ හ.

- බහුමන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමයෙන් කොමිසම අපේක්ෂා කළ අරමුණු ඉටු කරගැනීමට නම් කොන්දේසි දෙකක් ඉටු විය යුතුව තිබුනි. එනම් (1) බහු මන්ත්‍රී ආසනයක් සඳහා ඉදිරිපත් විය යුත්තේ සුළු ජාතීන් වෙනුවෙන් එක් අපේක්ෂකයෙකු පමණක් වීම සහ (2) එලෙස ඉදිරිපත් වන අපේක්ෂකයාට දේශපාලන පක්ෂ පදනමින් තොරව සුළු ජාතීන්ට අයත් සැම කෙනෙකුම ඡන්ද ප්‍රකාශ කිරීම. තමන්ගේම නියෝජිතයෙකු පත් කරගත හැකි ආකාරයට ඉහත සඳහන් අන්දමට සුළු ජාතීන් සැම විට ම ක්‍රියා කළ බව ලංකා මැතිවරණ ඉතිහාසය තුලින් දක්නට ලැබෙන්නේ නැත. උදාහරණ වශයෙන් 1952 සහ 1956 වසර වල පැවැති මහමැතිවරණ වලදී බදුල්ල සහ බලන්ගොඩ යන බහු මන්ත්‍රී ආසන වලින් කිසිඳු ද්‍රවිඩ අපේක්ෂකයෙකුට ජයග්‍රහණය කිරීමට හැකි වූයේ නැත.

- නාමකරණයෙන් මන්ත්‍රීවරුන් සය දෙනෙකු පත් කිරීමේ විධිවිධානයෙන් අපේක්ෂා කළේ යුරෝපීය, බර්ගර් සහ මුස්ලිම් ජාතිකයන් වෙනුවෙන් ප්‍රමාණවත් නියෝජිතයන් සංඛ්‍යාවක්

සිව්

  දෙනෙකු ද බර්ගර් ජාතිකයන් දෙදෙනෙකු ද 1952 මහමැතිවරණයෙන් පසු දෙවන පාර්ලිමේන්තුවට යුරෝපියයන් තිදෙනෙකු ද බර්ගර් ජාතිකයන් දෙදෙනෙකු ද පත් කරන ලද්දේ සුළුතර කණ්ඩායම් වලට ප්‍රමාණවත් නියෝජනයක් දීමේ අරමුණෙනි. එසේ වුව ද, 1965 සිට 1970 දක්වා බලයේ සිටි බණ්ඩාරනායක ආණ්ඩු සිංහල පීඩිත කුලවලට නියෝජනයක් දීම සඳහා මේ විධිවිධානය භාවිතා කළේ ය.

- තව ද, අගමැතිගේ උපදෙස් මත පත්වන මේ මන්ත්‍රීන් සැබැවින් ම සුළුජන මන්ත්‍රීවරුන් ලෙස හැඳින්වීමේ හැකියාවක් නොවී ය. මන්ත්‍රිවරුන් කිහිපදෙනෙකු හැරුණු විට සෙසු මන්ත්‍රීවරු සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීම වෙනුවට ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග වලට විරුද්ධ ව නො යැමට වග බලා ගත් හ.

- ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිසම පිහිටුවන ලද්දේ සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණෙන් නොවූව ද, කොමිසම පිහිටුවීම අරභයා ඇති කළ විධිවිධාන සහ එය ක්‍රියාත්මක වූ ආකාරය තුළින් සුළු ජන කණ්ඩායම් වලට අයත් රාජ්‍ය සේවකයන්ගේ ආරක්ෂාව කිසියම් ප්‍රමාණයකට ඉටු වූ බවක් පෙනෙන්නට තිබුණි.

**නිගමනය**

නිදහසින් පසු ලංකාවේ සුළු ජන අයිතිවාසිකම් රැක දීම සඳහා යහපත් අරමුණක් සෝල්බරි ව්‍යවස්ථාවේ සම්පාදකයින්ට තිබිණ. එහෙත් නිදහසින් පසු කාලයේද ජන වාර්ගික තරඟය උත්සන්න වීමේ ප්‍රතිපලය වූයේ මෙම විධි විධාන නිසි ලෙස ක්‍රියාත්මක නොවීමයි.

එහි අවසාන ප්‍රතිඵලය වූයේ දිවයින තුල වාර්ගික සම්බන්ධතා සාමකාමී ලෙස පවත්වා ගැනීමට, සෝල්බරි ව්‍යවස්ථාවේ විධි විධාන වලට නොහැකි වීමයි.

**6. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපති ධුරයේ බලතල සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධන මගින් සිදු කරන ලද වෙනස්කම් පෙන්වා දෙන්න.**

**(i) 18වන සංශෝධනය**

මෙම සංශෝධනය ගෙන ලද්දේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය කරන දේශපාලන ස්ථාවරත්වය සඳහා විධායක ජනාධිපතිවරයාගේ බලතල ශක්තිමත් කළ යුතු ය යන තර්කය මත ය. ඒ අනුව පහත සඳහන් වෙනස්කම් ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් සිදු කරන ලදි.

- ජනාධිපතිවරයා සඳහා පැවැති ධූර දෙකෙහි සීමාව ඉවත් කිරීම
- 17 වන සංශෝධනය මගින් ගොඩ නගන ලද සංවරණ සහ තුලන ක්‍රමයන්ගෙන් නිදහස් ව ජනාධිපතිවරයාට ස්වාධීන කොමිෂන් සභාවලට පත් කිරීම් කිරීමට බලතල ලබා දීම සහ එම කොමිෂන් සභා ජනාධිපතිට යටත්ව තැබීම
- ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන් ඉවත් කිරීමේ බලය ද ජනාධිපතිවරයාට ලබා දීම

පැවැතියේ බැඳීම්වලට ලක් නොවන උපදෙස් (non-binding advice) ජනාධිපතිවරයා වෙත ලබා දීමට ය. මෙමගින් ඉහළ අධිකරණ වලට, ස්වාධීන කොමිසන් සභාවලට සාමාජිකයන් ඍජුව සහ සිය අභිමතය අනුව පත් කිරීමට ජනාධිපතිවරයාට අධිකාරිය ලබා දෙන ලදි.

- මේ සංශෝධනයෙන් නීතිපති, විගණකාධිපති, ඔම්බුඩ්ස්මන්, පාර්ලිමේන්තු මහලේකම් සහ අධිකරණ සේවා කොමිසමේ සභාපති හැර සෙසු සාමාජිකයන් පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිගේ බලය පුළුල් කරන ලදි.

### නිගමනය

18 වන සංශෝධනයෙහි සමස්ත ප්‍රතිඵලය වූයේ ජනාධිපතිවරයාගේ තත්වය, බලතල සහ අධිකාරිය තවදුරටත් ශක්තිමත් වීම ය. ඒ අනුව 1978 මුල් ව්‍යවස්ථාව යටතේ පැවැති ජනාධිපතිධූරයට වඩා 18 වන සංශෝධනය යටතේ පැවැති ජනාධිපතිධූරය වඩා බලගතු විය. මෙලෙස 18 වන සංශෝධනයෙන් නැවත ශක්තිමත් කරන ලද ජනාධිපතිවරයාගේ විධායක බලය අධිකරණය, රාජ්‍ය සේවය සහ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය කෙරෙහි අභියෝගයක් විය.

### (ii) 19වන සංශෝධනය

19 වන සංශෝධනය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද සංශෝධන අතුරින් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදි සංශෝධනය ලෙස හැඳින්විය හැකි ය.

එහි ප්‍රධාන අංග මෙසේය

- ජනාධිපතිවරයාගේ බලතල ක්‍රියාවට නැංවීම සංවරණ හා තුලන ක්‍රමයන්ට යටත් කිරීම.
- මේ අනුව 18 වන සංශෝධනයෙන් මුළුමනින් ම ජනාධිපති වටා ඒකරාශිකර තිබුණු විධායක බලය ක්‍රියාවට නැංවීම අගමැති සමග සිදු කිරීමට විධිවිධාන යෙදීම.
- ව්‍යවස්ථා සභාව නැවත පිහිටුවන ලද අතර එතෙක් ජනාධිපතිවරයා සතුව පැවැති ඇතැම් පත් කිරීම් පිළිබඳ බලයට එමගින් සංවරණ යෙදීම. එනම් ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලබන ඇතැම් පත් කිරීම් ව්‍යවස්ථා සභාව විසින් නියාමනය කිරීම.
- 19 වන සංශෝධනය ක්‍රියාත්මක කිරිමට පෙර ඇමතිවරු පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සැළකිය යුතු බලයක් භුක්ති වින්දේ ය. මෙම සංශෝධනයෙන් ඇමතිවරුන් සහ රාජ්‍ය ඇමැතිවරුන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට සීමාකම් පැනවිණි. ඒ අනුව කැබිනට් ඇමතිවරුන් 30 කට වඩා පත් කළ නොහැකි ය. රාජ්‍ය ඇමැතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් 40 කට වඩා පත් කළ නොහැකි ය.
- ජනාධිපති විසින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් අතුරින් ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමැතිවරුන් කිරිම පත් කළ යුත්තේ අගමැතිවරයාගේ උපදෙස්වලට යටත්ව ය.
- ජනාධිපතිවරයාට ඇමති මණ්ඩලයේ සංයුතිය, ඇමැතිවරුන්ට පවරන ලද විෂය කාර්ය වෙනස් කළ හැකි වුව ද, ඇමැතිවරුන් සිය ධූර වලින් පහකළ හැක්කේ අගමැතිගේ උපදෙස් මත ය.
- කැබිනට් මණ්ඩලය විසුරුවා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතුව පැවති බලය ඉවත් ලදි.

රන

- ජනාධිපති නිල කාලය වසර පහ දක්වා අඩු කිරීම සහ ජනාධිපතිධූරය කෙරෙහි මුල් ව්‍යවස්ථාවෙහි පැවැති වාර දෙකෙහි සීමාව නැවත හඳුන්වා දීම.
- පාර්ලිමේන්තු නිල කාලය වන වසර පහෙන් අවසන් මාස හය තුල හැර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකි වීම.

- 19 වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයාගේ නිල කටයුතු මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අධිකරණ බලයට යටත් කිරීම. ඒ යටතේ සිවිල් සහ අපරාධමය කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරාගේ මුක්තියට සීමාවක් පැනවිණි.
- 1978 මුල් ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයා වෙත පවරන ලද බලතල සහ කාර්යයන්ට අතිරේකව තවත් බලතල සහ කාර්යයන් කිහිපයක් මේ සංශෝධනයෙන් ජනාධිපතිවරයා වෙත පවරා ඇත. ඒවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපදින බවට සහතික වීම, ජාතික සහයෝගීතාව සහ සංහිඳියාව සහතික කිරීම, ව්‍යවස්ථා සභාව සහ සෙසු කොමිසන් සභාවල ස්වාධීනත්වයට පහසුකම් සැළසීම සහ මැතිවරණ කොමිසමේ උපදෙස් මත නිදහස් සහ සාධාරණ මැතිවරණ සහ ජනමතවිචාරණ පැවැත්වීම සුදුසු සහ හිතකර පරිසරයක් ඇති කිරීම

**නිගමනය**

- 19 වැනි සංශෝධනය, 1978 මුල් ව්‍යවස්ථාව යටතේ පැවති 'විධායක' ජනාධිපති ක්‍රමයේ සමස්ත ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම අරමුණු කොට ගෙන සකස් කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනාවක ප්‍රතිඵලයකි.
- ජනාධිපතිවරයාගේ බලය සීමා කිරීම එම ප්‍රතිසංස්කරණ ව්‍යායාමයේ එක් වැදගත් පැතිකඩකි. ඒ මගින් පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩු ක්‍රමයේ මූලික පැති කිහිපයක් ලංකාවේ ආණ්ඩු ක්‍රමයට යළිත් හඳුන්වා දෙනු ලැබේ.
- එසේ වුවද මෙම ප්‍රතිසංස්කරණය නිසා අනපේක්ෂිත අයහපත් ප්‍රතිඵල ද ඇති විය. 2018 වසරේ අගදී සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය එහි එක් නිෂේධනීය ප්‍රතිඵලයකි.

**7. (i) 'ගැටුම' යන සංකල්පය අර්ථ දක්වන්න.**

- ගැටුමක් යනු පුද්ගලයන්, සමාජ කණ්ඩායම් හෝ රාජ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇතිවන විශේෂ සම්බන්ධතාවකි.
- ගැටුමක් යනු 'එකිනෙකාට නොපෑහෙන අරමුණු ඇති පාර්ශව දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් අතර ඇති සම්බන්ධතාවයකි' යන ක්‍රිස්ටෝපර් මිචෙල් දක්වා ඇති අර්ථකථනද සිසුන්ට භාවිත කළ හැකිය.

*(ලකුණු 05)*

**(ii) ගැටුම් වර්ගීකරණය කර ඇති ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.**

1. සරල වර්ගීකරණය
2. කෘත්‍යවාදී වර්ගීකරණය
3. දේශපාලන වර්ගීකරණය

**1. සරල වර්ගීකරණය**

i. පුද්ගල අභ්‍යන්තර ගැටුම්; එනම් පුද්ගලයින්ට තම සිත ඇතුලේ ඇතිවන ගැටුම්, මෙම ප්‍රභේදයට අයත් ය.

ii. අන්තර් පුද්ගල ගැටුම්; පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර තම අන්තර් සම්බන්ධතා වලදී ඇතිවන ගැටුම් ය.

iii. කණ්ඩායම් ඇතුලත ඇතිවෙන ගැටුම්; සමාජ කණ්ඩායමකට අයත් වන පුද්ගලයින්ගේ වෙනස් අරමුණු සහ අභිලාෂ මත පදනම්ව හට ගැනෙන ගැටුම්.

iv. කණ්ඩායම් අතර ඇතිවන ගැටුම්; මෙයට අයත් වන්නේ එකිනෙකාට නොපැහෙන අරමුණු නිසා පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම් ය.

**2. කෘත්‍යවාදී වර්ගීකරණය**

දෙයාකාරයක ගැටුම් කෘත්‍යවාදී වර්ගීකරණයට අයත් වේ.

i. සාධනීය ගැටුම්, එනම්, ගැටුම අවසානයේදී, තමන්ට එයින් වාසියක් ඇති වූ බව ගැටුමෙහි පාර්ශ්වකරුවන් සිතන්නේ නම් එය සාධනීය ගැටුමකි.

ii. නිෂේධනීය ගැටුම්. නිෂේධනීය ගැටුමකදී පාර්ශ්ව සිතන්නේ ගැටුම නිසා තමන්ට අලාභයක් සිදුවූ බවයි. එවැනි ගැටුම්වලදී සිදුවන්නේ ගැටුම අලුත් කිරීමට පාර්ශ්ව පෙළඹීමයි.

**3. දේශපාලන වර්ගීකරණය**

මහාචාර්ය පීටර් වොලන්ස්ටීන්, තුන් ආකාරයක දේශපාලන ගැටුම් ඇති බව පෙන්වා දෙයි.

i. අන්තර් රාජ්‍ය ගැටුම්; මේවා රාජ්‍යයන් දෙකක් හෝ කිහිපයක් අතර, දේශ සීමා හෝ සම්පත් පිළිබඳ මතභේද නිසා හටගන්නා ගැටුම්ය. සමහර විට මෙවැනි ගැටුම් අන්තර් රාජ්‍ය යුද්ධ බවට ද පත් විය හැකිය.

ii. රාජ්‍ය අභ්‍යන්තර; ගැටුම් රාජ්‍යයන් ඇතුළත සිදුවන ගැටුම්වලට බොහෝ විට පදනම් වන්නේ දේශපාලන බලය පිළිබඳ ප්‍රශ්නයි. ව්‍යූහාත්මක, සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ මතවාදී හේතු ඒවාට සාමානයයෙන් තුඩු දෙයි.

iii. රාජ්‍ය නිර්මාණ ගැටුම්

- මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් කියන පරිදි රාජ්‍ය නිර්මාණ ගැටුම් යනු රාජ්‍යයක් තුළ යම් කිසි භූමි ප්‍රදේශයකට අයිතිවාසිකම් කියන ප්‍රජාවක් සහ රාජ්‍යය අතර ඇති වන ගැටුම් ය.
- වාර්ගික අනන්‍යතාව, ප්‍රාදේශීය අනන්‍යතාව, බලය බෙදා ගැනීම යන මේවා අවධාරණය කරන ගැටුම් රාජ්‍ය නිර්මාණ ගැටුම් ය.

ින්

පවත්නා දේශපාලන ව්‍යූහ ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ.

*(ලකුණු 10)*

**(iii) ගැටුම් සමථන මාධ්‍යයක් ලෙස සහමන්ත්‍රණය (negotiation) යන සංකල්පය ලුහුඬින් පැහැදිලි කරන්න.**

- ගැටුම් සමථන ක්‍රියාවලියේදී උපයෝගී කර ගන්නා ප්‍රධාන මාධ්‍ය හතරක් තිබේ. සහමන්ත්‍රණය ඒවායින් එකකි. අනෙක් ඒවා නම් මැදිහත්කරණය, සාම ගිවිසුම් සහ සාමය ගොඩනැගීම ය.
- ගැටුම් උත්සන්න වීම වැළැක්වීමට සහ ගැටුම් විසදීමට පාර්ශව අතර සහමන්ත්‍රණය අවශ්‍ය වේ.
- රොජර් ෆිෂර් සහ විළියම් යූරි සහමන්ත්‍රණය යන්න අර්ථ දක්වන්නේ මෙපරිදිය. 'සහමන්ත්‍රණය යනු අපට අන්‍යයන්ගෙන් ලබා ගැනීමට වුවමනා දේ ලබා ගැනීම සඳහා යොදා ගන්නා මාධ්‍යයකි. ඔබ සහ අනෙක් පාර්ශ්වය අතර බෙදාගත හැකි පොදු අභිලාෂ මෙන්ම පටහැනි අභිලාෂද පවතින විට දෙපාර්ශවය අතර එකගතාවක් ඇතිකර ගැනීම අරමුණු කොට ගෙන සිදුවන සන්නිවේදන හුවමාරුව සහමන්ත්‍රණයයි.'
- සහමන්ත්‍රණය යනු ගැටුමකට හෝ ආරවුලකට මැදි වී සිටින පාර්ශ්ව ඒවා විසඳා ගැනීම සඳහා 'කථා කිරීමේ' නැතහොත් 'සාකච්ඡා කිරීමේ' ක්‍රියාවලියයි.
- සහමන්ත්‍රණ ආකාර තුනක් තිබේ. ඒවා නම් (අ) ගැටලු විසඳීමේ සහමන්ත්‍රණය, (ආ) ආරවුල්කාරී සහමන්ත්‍රණය, සහ (ඇ) නම්‍යශීලී සහමන්ත්‍රණය යි.

**8. ප්‍රංශයේ ඩිගොල්වාදී ආණ්ඩුක්‍රමයේ ඇති ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.**

**හැඳින්වීම**

- ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩුවේ ආණ්ඩුක්‍රමය ඩිගෝල්වාදී ආණ්ඩුක්‍රමය ලෙසද හැඳින්වේ. එයට හේතුව එය ජනරාල් චාල්ස් ඩිගෝල් විසින් ඇති කරනු ලැබීමයි.
- එය විසින් කලින් පැවති පාර්ලිමේන්තුවේදී ආණ්ඩුක්‍රමය අහෝසි කර අර්ධ ජනාධිපති ක්‍රමයක් ඇති කරන ලදි.
- පස්වැනි සමූහාණ්ඩුව බොහෝ සේ මධ්‍යගත, ඒකීය ආණ්ඩු ක්‍රමයක් ද වේ.
- දේශපාලන අස්ථාවරභාවයට, දූර්වල විධායකය සහ මනා ලෙස සංවිධාන ගත නොවූ දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවතීම යන දූර්වලතා සහිතව තුන්වැනි හා සිව්වැනි සමූහාණ්ඩු යටතේ පැවති ආණ්ඩුක්‍රම විස්ථාපනය කිරීම එහි අරමුණ විය.
- නව ව්‍යවස්ථාවේ ප්‍රධාන නිර්මාණය වූයේ බල සම්පන්න ජනාධිපති ධූරයයි.
- මෙය වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රමයෙන් වෙනස් ආණ්ඩුක්‍රම ආකෘතියකි.

*(ලකුණු 03)*

**අන්තර්ගතය**

- ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා, ද ජාතික සමගියේ සංකේතයද වෙයි.
- රටේ ඇති දේශපාලන බෙදීම් සහ පක්ෂ දේශපාලනයෙන් ස්වාධීනය සිටිය යුතු යැයි අපේක්ෂා කෙරේ. (ඇල්ජීරියානු අර්බුදය අවස්ථාවේ දී මෙන්)
- ජනාධිපතිවරයා සිටින්නේ පාර්ලිමේන්තුවට ඉහළිනි. පාර්ලිමේන්තුව අගමැතිවරයා හා කැබිනට් මණ්ඩලය ජනාධිපතිවරයාට පහළින් සිටිති.

- ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වඩා බලතල අතින් බලවත් විධායකයේ ප්‍රධානියාය.
- අගමැතිවරයා සහ ඇමතිවරුන් පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.
- ඇමතිවරුන්ට කැබිනට් මණ්ඩලයේ සහ ව්‍යවස්ථාදායකයේ සමගාමී සාමාජිකත්වය දැරිය නොහැකිය. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෙකු කැබිනට් මණ්ඩලයට පත් කරනු ලැබූ විට ඔහු/ ඇය පාර්ලිමේන්තුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය යුතුය.
- විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර බලතල බෙදීමක් තිබේ.
- මුලදී තිබුණේ ජනාධිපතිවරයා ඡන්ද විද්‍යාලයකින් තෝරා පත් කිරීමේ ක්‍රමයයි. පසුව 1962 දී එය වෙනස් කර, ජනාධිපතිවරයා සෘජු මහජන ඡන්දයෙන් පත් කරනු ලැබීම ආරම්භ විය.
- ජනාධිපතිවරයාට හදිසි අවස්ථා බලතල ද තිබේ. ඔහුට හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකිය.
- ජනාධිපතිවරයා තෝරා පත් කරන්නේ පස් වසරක ධූර කාලයකටය.
- ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා පත් කරනු ලබන අතර, ඔහු කැබිනට් ඇමතිවරුන් පත් කරන්නේ අගමැතිවරයාගේ උපදෙස් මතය.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොවන අයෙකු අගමැති ලෙස පත් කිරීමට ද ජනාධිපතිවරයාට බලය තිබේ.
- අගමැතිවරයා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ පසු ඔහුට/ ඇයට පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය ලබා ගැනීම අවශ්‍ය නොකෙරේ. අගමැතිවරයාට වැදගත් වන්නේ ජනාධිපතිවරයාගේ විශ්වාසයයි.

*(ලකුණු 15)*

**නිගමනය**

- සත්වැනි සමූහාණ්ඩුවෙන් ප්‍රංශයට හඳුන්වා දෙන ලද්දේ ද්විත්ව විධායක සහ අර්ධ ජනාධිපති ක්‍රමයකි.
- ඩිගෝල්වාදී ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ
  (අ). ආණ්ඩුක්‍රමය ජනාධිපති කේන්ද්‍රීය වීම
  (ආ). විධායකය ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීන වීම.
- ශ්‍රී ලංකාවේ 1978 පළමු ජනරජ ව්‍යවස්ථාව විසින් ඇති කරන ලද ආණ්ඩුක්‍රමයට ආදර්ශය වූයේ ප්‍රංශයේ ඩිගෝල්වාදී ආණ්ඩුක්‍රමයයි.
- මෙම ප්‍රංශ ඩිගෝල්වාදී ආණ්ඩු ක්‍රමය බොහෝ කලකින් සංශෝධන වලට භාජනය කර නැත.

*(ලකුණු 02)*

**9. (i) 'රාජ්‍ය ප්‍රතිපත්ති' යන්න නිර්වචනය කරන්න.**

"

ආශ්‍රයෙන් "රාජ්‍ය ප්‍රතිපත්ති" යන්න පිළිබඳව පැහැදිළි අවබෝධයක් ලබා ගැනීමට අපට හැකි වේ.

- රාජ්‍ය ප්‍රතිපත්ති යනු දේශපාලන ක්‍රියාවලියකි. එය සියලු පුරවැසියන්ට අදාළ දෙයක් ද වෙයි.
- රාජ්‍ය ප්‍රතිපත්ති යනු එක් ප්‍රතිපත්ති ලේඛනයකට හෝ අවස්ථාවකට සීමා වන්නක් නොවේ.

- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේ අවධි කිහිපයක් තිබේ. ඒවා නම් ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය සකස් කිරීම, ප්‍රතිපත්ති නිර්මාණය, ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම සහ ප්‍රතිපත්ති ඇගයීමයි.
- රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කරන්නේත්, ක්‍රියාවට නගන්නේත් දේශපාලන අධිකාරියයි.
- රාජ්‍ය ප්‍රතිපත්ති වලින් ආමන්ත්‍රණය කරන කරුණු ඇත්ත වශයෙන් පවතින ඒවා මෙන්ම මනඃකල්පිත ඒවා ද විය හැකිය.
- රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වරූපය, අන්තර්ගතය සහ ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය, ප්‍රතිපත්ති සම්පාදනය කරන බලධාරීන් සතුව ඇති තොරතුරු අනුව වෙනස් විය හැකිය.
- තොමස් ආර් ඩයි රාජ්‍ය ප්‍රතිපත්ති යන්න අර්ථ දක්වන්නේ ආණ්ඩු කරන්නේ මොනවාද? ඒවා එසේ කරන්නේ මන්ද? සහ එයින් ඇතිවන වෙනස කුමක්ද යනුවෙනි.
- හැරල්ඩ් ලැස්වෙල්ට අනුව, ආණ්ඩුවේ ක්‍රියාකාරී සැලසුමේ ඇති අපේක්ෂිත වැඩසටහන් අරමුණු, ඇගයීම් සහ භාවිත රාජ්‍ය ප්‍රතිපත්තියට අයත් වෙයි.
- ජෙම්ස් ඇන්ඩර්සන් රාජ්‍ය ප්‍රතිපත්තිය යන්න අර්ථ දක්වා තිබෙන්නේ, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව ඇති දැනුම ප්‍රයෝජනයට ගනිමින් යම් කිසි ගැටළුවක් විසඳීම සඳහා ආණ්ඩුවේ ක්‍රියාධරයන් අනුගමනය කරන පැහැදිළි අරමුණක් සහිත ක්‍රියාවලියක් ලෙසය.

*(ලකුණු 05)*

**(ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේදී දේශපාලන විධායකය සහ ස්ථිර විධායකය සතු භූමිකාව පැහැදිලි කරන්න.**

**හැඳින්වීම**

- නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමවල රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේදී දේශපාලන සහ ස්ථිර විධායකය යන දෙකම වැදගත් කාර්ය භාරයක් ඉටු කරති.
- සාම්ප්‍රදායික වටහා ගැනීම් වූයේ ප්‍රතිපත්ති සම්පාදනය දේශපාලන විධායකයේ වගකීම බවත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ස්ථිර විධායකයකට අයත් නිලධාරීන්ගේ කාර්යය බවත්ය.
- දේශපාලන හා ස්ථිර විධායකයට අමතරව, තවත් බල ආයතන දෙකක් ද, අවශ්‍ය අවස්ථාවන්හි රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට සම්බන්ධ වෙති. ඒ ව්‍යවස්ථාදායකය සහ අධිකරණයයි.
- ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන් ඇති රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට ප්‍රාදේශීය හා පළාත් පාලන අධිකාරීහු ද සම්බන්ධ වෙති.

*(ලකුණු 03)*

<u>දේශපාලන විධායකයේ කාර්යභාරය</u>

- දේශපාලන න්‍යායට අනුව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ අවසාන බලධාරියා වන්නේ දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයයි.
- දේශපාලන විධායකය, රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය පිළිබඳව ව්‍යවස්ථාදායකය හරහා මහජනතාවට වගකියති.

- ජනාධිපති ආණ්ඩුක්‍රමයකදී පවා ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට නායකත්වය දෙන්නේ දේශපාලන විධායකයයි.
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන විධායකය, සිවිල් සේවය මත රැඳෙයි.
- පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල, ව්‍යවස්ථා සම්පාදන න්‍යාය පත්‍රය කුමක්දැයි තීරණය කරන්නේ දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයයි.
- එබැවින් දැනට සිදුවන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී දේශපාලන විධායකය, ව්‍යවස්ථාදායකය අභිභවා සිටීමයි.

<u>ස්ථිර විධායකයේ කාර්යභාරය</u>

- නූතන රාජ්‍යවල ස්ථිර විධායකය පිහිටුවා තිබෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හා රාජ්‍ය පරිපාලන කටයුතු වලටය. එය 'නිලබල ක්‍රමය' සහ 'සිවිල් සේවය' යනුවෙන් හඳුන්වනු ලබන පුද්ගලයින්ගෙන් සමන්විත ස්ථිර ආයතනයකි.
- ස්ථිර විධායකය යන්න සළකනු ලැබෙන්නේ අ-දේශපාලනික විශේෂඥයින්ගෙන් සමන්විත ආයතනයක් ලෙසය. ආණ්ඩුව වෙනස් වුවද, මෙම ස්ථිර විධායකය වෙනස් නොවේ. එබැවින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සැළකෙනු ලබන්නේ දේශපාලන නොවන තාක්ෂණික ව්‍යායාමයක් ලෙසයි.
- ස්ථිර විධායකයේ ප්‍රධාන කාර්යය ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමයි. එය දේශපාලන විධායකයේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන්නේ ස්වාධීනවයි.
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ සාම්ප්‍රදායික න්‍යායට අනුව ස්ථිර විධායකයට ප්‍රතිපත්ති සම්පාදන වගකීමක් නැත.
- එහෙත් වර්තමානයේ සැළකෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති වල ඇති සංකීර්ණතාව නිසා නිලධාරීන් දේශපාලඥයින් අභිභවා ඉදිරියට පැමිණ ඇති බවයි. ඔවුනට ඒ සඳහා අවශ්‍ය විශේෂඥතාව ද, දැනුම ද, තොරතුරු ද තිබේ.
- සමහරුන් තර්ක කරන්නේ වර්තමානයේ නිලධාරීන් සැබෑ ප්‍රතිපත්ති සම්පාදකයින් වී ඇති බවයි. මෙය හැඳින්වෙන්නේ දේශපාලනය නිලධාරීකරණය වීම ලෙසය.

***(ලකුණු 10)***

**නිගමනය**

- ප්‍රතිපත්ති ක්‍රියාවලියේ දී දේශපාලන විධායකය සහ ස්ථිර විධායකය සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියා කිරීම අවශ්‍ය වේ. එමෙන්ම ස්ථිර විධායකය දේශපාලන වශයෙන් අපක්ෂපාතී විය යුතුය.
- දේශපාලඥයින් ද මහජනතාව ද රාජ්‍ය පරිපාලනයට ඍජුව බලපෑම් නොකළ යුතු යයිද මතයක්
- රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් මහජන ප්‍රශ්න විසඳී නැතැයි යන විවේචනය ද සමාජයේ තිබේ. රැකියා විරහිත භාවයේ ගැටලුව නොවිසඳී තිබීම නිදසුනකි.
- නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල ස්ථිර විධායකය රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී විශාල කාර්යයක් ඉටු කරයි. නිලධාරීන් සතු විශේෂඥ දැනුම හා පළපුරුද්දත් සංකීර්ණ සමාජ ගැටළු පිළිබඳ ඔවුන් සතු අවබෝධයත් එයට හේතුවයි.

***(ලකුණු 02)***

**10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක**

- භූ - දේශපාලනික සහ මූලෝපායයික සාධක

i. ඉන්දියානු සාගරයේ මධ්‍ය ලක්ෂයක පිහිටීම

➢ ශ්‍රී ලංකාව ඓතිහාසික සහ නූතන ප්‍රධාන නාවුක මාර්ගවලට යාබද දිවයිනක් වශයෙන් පිහිටා තිබීම.

➢ ලෝක බලවතුන්ගේ සාගරික උපාය මාර්ගවල (වෙළඳ, ආර්ථික, දේශපාලනික සහ ආරක්ෂක ආදී වූ උපාය මාර්ග) නොසලකා හැරිය නොහැකි ස්ථානයක පිහිටීම.

ii. දකුණු ආසියාතික රටක් සහ ඉන්දියානු සාගරයේ වටද්දර කලාපයේ (Indian ocean rim region) රටක් ලෙස පිහිටා තිබීම.

➢ මේ නිසා බහු පාර්ශ්වික විදේශ ප්‍රතිපත්තිය ආශ්‍රිතව SAARC කලාපීය සංවිධානයේත්, BIMSTEC, IORA වැනි සාගරික වටද්දර කලාපීය සංවිධානවලත් ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස ක්‍රියාත්මක වීම.

- කලාපීය සහ ජාත්‍යන්තර බල තුලනය

ගෝලීය බල තුලනයේ සිදුවන වෙනස්කම් සහ දකුණු ආසියා කලාපයේ මෙන්ම ආසියාවේ සිදුවන දේශපාලන, ආර්ථික, වෙළඳ සහ ආරක්ෂක යන ක්ෂේත්‍රවල වෙනස්කම් විදේශ ප්‍රතිපත්තියේ හැඩය තීරණය කිරීමට බලපාන බව.

- දේශපාලන ආර්ථිකය

නිදහසින් පසු බලයට පත් ආණ්ඩු අනුමානය කරන ආර්ථික සහ සංවර්ධන දෘෂ්ටිවාද, උපාය මාර්ග සහ සැලසුම්.

- පාලන තන්ත්‍රයේ සහ දේශපාලන ප්‍රභූන්ගේ අභිලාෂ

බලයට පත් වන පාලන තන්ත්‍ර සහ දේශපාලන නායකයින්ගේ අභිලාෂ අනුව බහු පාර්ශ්වික සහ ද්වි පාර්ශ්වික විදේශ ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදුවන බව.

- ජාතික අභිලාෂයන් සහ ජාතික බලය

ජාතියක් ලෙස පවතින අභිලාෂ (national interests) සහ දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික ධාරිතාවන්, මිලිටරි ශක්තිය යනාදී සාධක විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කරන බව.

- ජන සමාජයේ අපේක්ෂා, මහජන මතය සහ අධිපති දෘෂ්ටීන්

මහජන මතය සහ බහුතර මහජන මතය හැසිරවිය හැකි අධිපති දෘෂ්ටීන් විදේශ ප්‍රතිපත්තියට බලපාන බව.

- කුඩා රාජ්‍යයක් (Small state) වීම

රාජ්‍යයන්ට අනන්‍යවන ගැටළු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන බව. ප්‍රධාන බලවතුන් පසුපස යාමට සිදුවීම (band wagoning) ඒ හේතුකොටගෙන සිදුවන තත්ත්වයකි.

### (ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ව්‍යවස්ථානුකූලවාදය

I. පටු අර්ථය : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ ආණ්ඩු ක්‍රමයේ ස්වභාවය, ආයතන සහ භාවිත තීරණය කරනු ලැබ තිබීම සහ ඒ අනුව ආණ්ඩුකරණය සිදුවීම.

II. පුළුල් අර්ථය : සංවරණ සහ තුලන, බලතල බෙදීම, බලතල වෙන් කිරීම, මූලික නිදහස සහ මූලික අයිතීන් සුරක්ෂිත කිරීම සහ නීතියේ ආධිපත්‍ය සහිත ආණ්ඩු ක්‍රමයකට පදනම් මූලධර්ම සැකසීම.

- මහජන පරමාධිපත්‍ය

ආණ්ඩු බලය ජනතාව නැමැති උල්පතින් නිර්මාණය වන බව සැලකීම සහ දේශපාලන බලය මහජන කැමැත්ත මත රඳා පැවතීම.

- බලතල වෙන් කිරීම සහ බලතල බෙදීම

ආණ්ඩු බලය එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීම මෙහි අරමුණයි.

- සංවරණ සහ තුලන

I. ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආයතනවලින් එකක් අනිත් ආයතන අභිබවා යන්නේ නම් එම ආයතනය සෙසු ආයතන විසින් සංවරණය කළ යුතු බව.

II. ආණ්ඩුවේ ආයතන අතර බල සමතුලිතතාව.

- නීතියේ ආධිපත්‍යය

I. නීතිය ඉදිරියේ සමානත්වය (equality before law)

II. ව්‍යවස්ථාදායක සහ විධායක බලය පුද්ගල නිදහස ආරක්ෂා කරනු පිණිස නෛතික සංවරණයකට සහ අධිකරණයේ විමර්ශනයට පාත්‍ර විය යුතු වීම.

- මානව අයිතිවාසිකම් තහවුරු වීම.

විශ්ව පරිමාණ මානව අයිතිවාසිකම් සහ ව්‍යවස්ථාවෙන් අර්ථ දක්වනු ලබන මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම.

- සීමිත ආණ්ඩුව.

- ප්‍රජාවට වගවීම.

- නිදහස් සහ සාධාරණ මැතිවරණ.

## (iii) ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය ක්‍රියාධරයෝ

රාජ්‍යය ක්‍රියාධරයින් වශයෙන් ජාතික රාජ්‍යය සහ සෘජුවම ජාතික රාජ්‍ය විසින් සාමාජිකත්වය දැරෙන සහ හැසිරවෙන අන්තර්ජාතික සංවිධාන මෙයින් අදහස් කෙරේ.

### 1. ජාතික රාජ්‍යය

- ජාත්‍යන්තර දේශපාලනයේ සාම්ප්‍රදායිකව ප්‍රධාන ක්‍රියාධරයා ලෙසින් සැලකුනේ ජාතික රාජ්‍යයන්ය. මෑත කාලීනව රාජ්‍ය නොවන ක්‍රියාධරයින් ජාත්‍යන්තර පද්ධතිය තුළ බලපෑම් සහගත තත්වයක් අත්කර ගත්ත ද ඒ තුළ රාජ්‍යයේ භූමිකාව දුර්වල වී නැත.
- නූතන ජාතික රාජ්‍යයට පදනම වැටුණේ 1648 වෙස්ට්ෆේලියා ගිවිසුම මගින් ඇති කළ එකඟතා ආශ්‍රයෙනි. වෙස්ට්ෆේලියානු මූලධර්ම විසින් රාජ්‍ය අභ්‍යන්තර (intra state) සහ අන්තර් රාජ්‍ය (inter state) සම්බන්ධතා සම්බන්ධ වැදගත් කොන්දේසි දෙකක් ප්‍රකාශයට පත් කෙරිණි.

I. රාජ්‍යයන් ස්වාධිපති ඒකකයන් ය. අභ්‍යන්තර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍යයන්ට ස්වාධීනත්වය හිමි වේ.

II. රාජ්‍ය අතර සම්බන්ධතා රාජ්‍යයන්ගේ ස්වාධිපත්‍යය ස්වාධීනත්වය පිළිගැනෙන සේ හැඩ ගැසිය යුතුය.

- 1933 මොන්ටිවිඩියෝ සම්මුතිය මගින් භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ සෙසු රාජ්‍යයන් සමග සබඳතා පැවැත්විය හැකිවීමේ ධාරිතාව රාජ්‍යයේ අංග ලක්ෂණ ලෙසින් ප්‍රකාශයට පත් කෙරිණි.

### 2. අන්තර් ජාතික රාජ්‍ය සංවිධාන

- ආණ්ඩුව මගින් සෘජුවම රාජ්‍යයන් නියෝජනය කෙරෙන අන්තර්ජාතික සංවිධාන අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන ලෙස හැඳින්වේ.
- අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන රාජ්‍යයන්ගේ සාමූහික අවශ්‍යතා මුදුන්පත් කර ගැනීම පිණිසත්, බහු පාර්ශ්වීය සහයෝගීතාව (multi lateral cooperation) නිර්මාණය කිරීම උදෙසාත් ගොඩ නැගී ඇත.
- වත්මන් ජාත්‍යන්තර පද්ධතිය තුළ පුළුල්තම අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
- අරමුණු අතින් අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන වර්ග කිහිපයක් හඳුනාගත හැකිය.

i. ගෝලීය පරිමාණ සංවිධාන (උදා: එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය, ලෝක බැංකුව)

## (iv) ඉන්දීය ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ඉන්දියාව ඒකීය සහ සංධීය ලක්ෂණ දෙකම පෙන්නුම් කරන ආණ්ඩුක්‍රම මාදිලියක් සහිත නිසා අර්ධ සංධීය ව්‍යුහයක් සහිත බවට හඳුනා ගැනේ.


Past Papers Wiki - Download More Past Papers and Study Well!

- කෙසේ වෙතත්, සංධීය වාදය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ඍජුව සඳහන් වී නැත. එසේ වුවත් ඉන්දියාවේ ඇත්තේ සන්ධීය ක්‍රමයක්ය යන පොදු පිළිගැනීමක් තිබේ.
- අනෙකුත් සංධීය ක්‍රම වල මෙන් ප්‍රාන්ත වල බල සමමිතිකතාව ඉන්දීය ආණ්ඩු ක්‍රමයේ දක්නට නොලැබේ. ඒ වෙනුවට ඇත්තේ ප්‍රාන්ත අතර බල අසම්මිතික බවකි. ඒ අනුව සමහර ප්‍රාන්ත වලට අනෙක් ප්‍රාන්ත වලට වඩා වැඩි බලතල තිබේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක පැවැත්ම අවධාරණය කර තිබේ.
- එහෙත් මෑත කාලීන ප්‍රවණතා ප්‍රකට කරන්නේ ප්‍රාන්තවල ස්වායත්තතාව වැඩි දියුණු වෙමින් පවතින බවයි.
- ඇමරිකාවේ ඇති සාම්ප්‍රදායික සංධීය ක්‍රමයක දක්නට ලැබෙන ඍජු, දෘඪ භාවය ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ දක්නට නොලැබේ. ඒ වෙනුවට නම්‍ය සංධීය ක්‍රමයක් ඉන්දියාවේ පවතී.
- ඉන්දියානු ආණ්ඩුක්‍රමය වෙස්ට්මින්ස්ටර් ක්‍රමයත්, ජනරජ ක්‍රමයත් අතර මිශ්‍රණයක් හා එකතුවක් ලෙස නිර්මාණය කර තිබේ.

## (v) දේශපාලන පක්ෂවල කාර්යයන්

මැතිවරණමය හෝ වෙනත් ක්‍රමයකින් ආණ්ඩු බලය ජයග්‍රහණය කිරීම පිණිස සංවිධානය වී ඇති පුද්ගල කණ්ඩායමක් දේශපාලන පක්ෂයක් ලෙස හැඳින්විය හැක. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල දේශපාලන පක්ෂ සතු කාර්යභාරය අධිකාරිවාදී නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රමවල පක්ෂවල කාර්යභාරයෙන් වෙනස් විය හැකිය. සමස්ථයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල ඇති දේශපාලන පක්ෂවල කාර්යභාරය පහත සඳහන් පරිදි හඳුනාගත හැකිවේ.

### i. නියෝජනය

ඡන්ද දායකයින්ගේ සහ සාමාජිකයින්ගේ මත සහ අභිලාෂ දේශපාලන ක්‍රමය තුළ සහ දේශපාලන ආයතන තුළ නියෝජනය කරන්නේ පක්ෂ විසිනි.

- දේශපාලන අභිමතාර්ථ හැඩ ගැන්වීම - මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන, දැනුවත් කිරීමේ උපකරණ සහ ප්‍රචාරක රැස්වීම් ආශ්‍රයෙන් දේශපාලන වැඩසටහන් හැඩ ගැන්වීම.
- විවිධ සමාජ කණ්ඩායම්වල අභිලාෂ ඒකරාශී කිරීම සහ ඒවා දේශපාලන සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට එකතු කිරීම.
- ජනතාව මෙහෙය වීම සහ ජනතාවට දේශපාලන අධ්‍යාපනයක් ලබා දීම සහ ජනතාව දේශපාලන ඉලක්ක සඳහා මෙහෙය වීම.
- ආණ්ඩුබලය සංවිධානය කිරීම - ආණ්ඩුවට ඒකාග්‍රතාව සහ ස්ථාවරත්වය සැපයීම, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම වලට පක්ෂ වලින් තොර පැවැත්මක් නැත.

සහ

ආණ්ඩුව අතර සබඳතාව ගොඩ නැගීම තුළින් එය සිදු කෙරේ.

- දේශපාලන ප්‍රභූ කණ්ඩායම නිර්මාණය කිරීම සහ නව කණ්ඩායම් බඳවා ගැනීම. දේශපාලන ප්‍රභූ තන්ත්‍රය යනු දේශපාලන බලය අභ්‍යාස කරන සමාජ ස්තරයයි. නැතහොත් දේශපාලන පංතියයි. දේශපාලන පක්ෂවල ප්‍රධාන කාර්යක් වන්නේ මෙම දේශපාලන ප්‍රභූ ස්තරය නිර්මාණය කිරීම සහ ඒ වෙත නව සාමාජිකයන් බඳවා ගැනීමයි.

WWW.PastPapers.WIKI



Past Papers Wiki - Download More Past Papers and Study Well!